ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

වාර්ෂික වාර්තාව - 2015

පෙළගැස්ම **පිටුව**

1.	අපගේ දැක්ම/ මෙහෙවර	01 - 02
2.	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සභාපතිතුමාගේ පණිවිඩය	03 - 04
3.	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය	05
4.	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම කෙටියෙන් හඳුනා ගනිමු	06
5.	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ විගණන හා කළමනාකරන කමිටුව සහ ප්‍රසම්පාදන කමිටු	07
6.	ත්‍රිපෝෂ ආයතනයේ ඉතිහාසය හා වර්තමාන ප්‍රගතිය	08 - 09
7.	මානව සම්පත් විශ්ලේෂණය	10 - 11
8.	සැපයුම්කරුවන් පිළිබඳ විස්තර	12
9.	නිෂ්පාදන තොරතුරු හා අපේක්ෂිත ඉලක්ක	13 - 16
10.	ත්‍රිපෝෂ බෙදාහැරීමේ ක්‍රියාවලිය සහ තොරතුරු	17 - 20
11.	අවසන් ඉලක්කය	21
12.	2015 වර්ෂය තුළ අත් කරගත් ජයග්‍රහණ හා මුහුණ දීමට සිදු වූ ගැටළු	22 - 23
13.	ස්තුතිය	24
14.	විගණන වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනය	25 - 47
15.	කළමනාකරන ලිපිය	48 - 50

අපගේ දැක්ම

ශ්‍රී ලාංකේය පොදු ජනතාව

මන්දපෝෂණයෙන් තොර

සෞභාග්‍යමත් අභිමානවත්

නිරෝගීමත් පෝෂිත

ජාතියක් බවට පත් කිරීම

අපගේ මෙහෙවර

ආශ්චර්ය සපිරි හෙට දවස ලෝකය දිනවන
අප මාතෘ භූමියෙහි
සෞභාග්‍යමත්, තෙදවත්, ගුණවත්
ශ්‍රී ලාංකේය ජාතික අනාගතය උදෙසා
රාජ්‍ය භාණ්ඩාගාරයේ අනු දැනුමැතිව
සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහාය, අධීක්ෂණය
පරිපූර්ණව,
ස්වදේශීය ගොවියා බලසතු කරන
සැපයුම්කාරක බලමුළු සවි ගන්වා
උසස් නියමානුකූල ප්‍රමිති ගුණ පෝෂිත
ත්‍රිපෝෂ අතුරු ආහාරය
මනාව සෞඛ්‍ය ආරක්ෂිතව සාදවා, අසුරා, නිමවා,
සුවගුණ අපේක්ෂිත
ප්‍රතිලාභි ජන හිත සුව පිණිස ම
අඛණ්ඩව සපයා ප්‍රදානය කිරීම ද
සම්භාව්‍ය සේවා අභිමානයෙන් ඇප කැප වූ
මහ ක්‍රියාන්විත මෙහෙයුමකින්
දේශය ද - විශ්වය ද
ජය ගන්නා
යහපත් ත්‍රිපෝෂ පවුලක් වීම ද
විශ්වවිය සෞඛ්‍ය දර්ශක ඉලක්ක සපුරන
සෞඛ්‍ය සම්පන්න ශ්‍රී ලාංකේය ජාතියක පැවැත්ම
පිණිස විශිෂ්ඨ ලෙස කැපවූ ද
පළමු හා එකම දේශීය සමාගම වීම

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් හි සභාපතිතුමාගේ පණිවිඩය

පෝෂණයෙන් සපිරි නිරෝගිමත් ජනතාවක් බිහි කිරීමේ ජාතික මෙහෙවර ඉටු කිරීම උදෙසා ත්‍රිපෝෂ අතිරේක ආහාරය නිෂ්පාදනය කොට සෞඛ්‍ය සායන මගින් ශ්‍රී ලංකාවේ වෙසෙන සියළුම ගර්භනි මව්වරුන්, කිරිදෙන මව්වරුන් හා වයස අවුරුදු 05ට අඩු, අඩු බර දරුවන් උදෙසා නොමිලේ බෙදා හැරීම ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ආයතනය විසින් සිදු කරනු ලබන ප්‍රමුඛ ජාතික මෙහෙවරකි.

අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා සෞඛ්‍ය අමාත්‍යවරයාව සිටියදි එතුමාගේ සංකල්පයක් මත 2010.09.17 දින ත්‍රිපෝෂ වැඩසටහය, පූර්ණ රජය සතු සමාගමක් ලෙස ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් නමින් ස්ථාපිත කළ අතර එම අවස්ථාවේදි සමස්ථ ශ්‍රී ලාංකික අවශ්‍යතාවයෙන් සපුරාලිය හැකි වුයේ 60% - 70% ක ප්‍රමාණයකි.

නොමිලේ බෙදා හරිනු ලබන 100% ක ප්‍රතිලාභි අවශ්‍යතාවය සැපිරීමේ අරමුණු සාක්ෂාත් කිරීමට වර්තමාන සෞඛ්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමා විසින් අයවැය මගින් මුදල් ලබා දෙන ලදි. මේ හේතුවෙන් නව යන්ත්‍ර පද්ධතිය සවිබල ගැන්වීමේ කටයුතු ආරම්භ කිරීම තුළින් සමස්ත වාර්ෂික අවශ්‍යතාවය සම්පුර්ණයෙන්ම නොමිලේ ලබා දිමේ ඉලක්කය ජයගැනිමේ මූලික අඩිතාලම තැබීම අප විසින් මේ වසරේ සිදු වු සුවිශේෂිම සිදු විම බව සතුටින් ප්‍රකාශ කරමි.

එපමණක්ද නොව එම නොමිලයේ ලබා දෙනු ලබන ත්‍රිපෝෂ ප්‍රමාණය ප්‍රතිලාභීන්ට ලබා දිමෙන් පසුව ඇතිවන මෙ:ටො 800-900 ක පමණ වු අතිරික්ත ත්‍රිපෝෂ ප්‍රමාණය ගරු

සෞඛ්‍ය ඇමතිතුමාගේ මග පෙන්වීම මත වෙළඳපලට හඳුන්වා දිමද තව නොබෝ දිනකින් මල්වල ගන්වන්නට අප විසින් සැලසුම් සකස් කර ඇත. ඒ අනුව මේ වන විට සමස්ත ත්‍රිපෝෂ මාසික නිෂ්පාදනය මෙ:ටො 2,700 කි. ඉන් මෙ:ටො 1,800 ක ප්‍රමාණයක් නොමිලේ ලබා දෙනු ලබන අතර මෙ:ටො 900 ප්‍රමාණයක අතිරික්තය වෙළඳපල වෙත හඳුන්වා දිමට අපේක්ෂිතය. ගුණාත්මක බවින් ඉතා උසස් මට්ටමක ඇති මෙම අතිරේක පෝෂ්‍යදායි ආහාරය විශේෂයෙන්ම පාසැල් සිසුන්ටත්, වැඩකරන ජනතාවටත් සහනදායි මිලකට මිළදී ගැනිමට හැකි වන හෙයින් ඔවුනට මහත් ප්‍රයෝජනයක් සිදු වනවා ඇත.

මෙම අපහසු ඉලක්කයන් ඉතා කෙටි කාලයක් තුල ජයග්‍රහණය කිරිමට මා දිරිමත් කල අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා, ගරු සෞඛ්‍ය පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සමස්ත සේවක මණ්ඩලය හා අඛණ්ඩ නිෂ්පාදනයක් උදෙසා නිසිකලට අමුද්‍රව්‍ය සපයන අපගේ සැපයුම්කරුවන් හා අපහට නන් අයුරින් සහය දක්වන සියළු දෙනා කෘතඥ පුර්වකව සිහි කරමි.

එම්. ඩී. බන්දුසේන

සභාපති

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
අධ්‍යක්ෂ මණ්ඩලය - 2015

- සභාපති, එම්. ඩී. බන්දුසේන මහතා

- අධ්‍යක්ෂ, වෛද්‍ය පාලිත ගුණරත්න මහිපාල මහතා
  සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
  අධ්‍යක්ෂිකා පෝෂණ සම්බන්ධිකරණ අංශය
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, ඒ. ආර්. අහමඩ් මහත්මිය
  නීති නිළධාරිණී
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, තේජා හේරත් මහත්මිය
  ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිළධාරිණී
  කාර්මික තාක්ෂණ ආයතනය

- අධ්‍යක්ෂිකා, වෛද්‍ය දමයන්ති හපුගොඩ මහත්මිය
  ළමා රෝග විශේෂඥ
  පානදුර මහ රෝහල

- අධ්‍යක්ෂ, චින්තක කුලරත්න මහතා
  අධ්‍යක්ෂ
  ජාතික අයවැය දෙපාර්තමේන්තුව

- නිරීක්ෂක, එස්. ආර්. රාජපක්ෂ මහතා
  ප්‍රධාන ගණකාධිකාරී
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- තනුජා ප්‍රියදර්ශනි අල්විස් මහත්මිය
  අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ත්‍රිපෝෂ ආයතනය කෙටියෙන් හඳුනා ගනිමු

- ලිපිනය - තැ.පෙ. 17, කොළඹ පාර, කපුවත්ත, ජා-ඇල
- දුරකථන - 0112 - 236588
  0112 - 237418
  0112 - 233451
- ෆැක්ස් අංකය - 0112 - 237363
- ඊ-මේල් ලිපිනය - **thriposha@gmail.com**
- අමාත්‍යාංශය - සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
- ආයතනයේ ස්වභාවය - සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින පූර්ණ රාජ්‍ය සමාගමකි
- සමාගම් ලියාපදිංචි අංකය - PB /3873
- ප්‍රධාන නිෂ්පාදනය - පෝෂණ ගුණයෙන් හා සෞඛ්‍යයෙන් පිරිපුන් ත්‍රිපෝෂ අතිරේක ආහාරය
- බෙදා හැරීමේ මධ්‍යස්ථාන -
  * දිවයින පුරා ඇති සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථාන
  * වතු
  * පරිවාස හා ළමා රක්ෂණ මධ්‍යස්ථාන
- බෙදා හරිනු ලබන ආකාරය - දුම්රිය වැගන් හා ලොරි රථ මගින්
- ප්‍රතිලාභින් -
  * සියලු ම ගර්භනි මව්වරුන්
  * කිරිදෙන මව්වරුන්
  * පෝෂණ අවශ්‍යතා සහිත ළමුන්
  * ඇතැම් රෝගීන්
- මුළු ප්‍රතිලාභින් සංඛ්‍යාව - දශ ලක්ෂයකට ආසන්නය
- බැංකුව - ලංකා බැංකුව
- විගණක - කපිල රත්නසිංහ සහ සමාගම (වරලත් ගණකාධිකාරී) 83/1/2, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
විගණන හා කළමනාකරණ කමිටුව - 2015

- වින්තක කුලරත්න මහතා
  සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්‍ෂ - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
  සාමාජික - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂිකා - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- ඒ. ආර්. අහමඩ් මහත්මිය
  සාමාජික - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂිකා - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- එස්. ආර්. රාජපක්‍ෂ මහතා
  නිරීක්ෂක - විගණන හා කළමනාකරණ කමිටුව
  ප්‍රධාන ගණකාධිකාරි සෞඛ්‍ය අමාත්‍යාංශය

- නිශාන්ත හේවාගම මහතා
  මූල්‍ය කළමනාකරු
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- ආර්.එම්.එන්.කේ.බී. රත්නසිංහ මහතා
  කපිල රත්නසිංහ සහ සමාගම
  බාහිර විගණක
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- එල්. ජේ. එස්. ප්‍රේමචන්ද්‍ර මහතා
  අභ්‍යන්තර විගණක
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව
(රුපියල් මිලියන 60 දක්වා)

- සභාපති
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- ප්‍රධාන ගණකාධිකාරි
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා
  පෝෂණ හා සම්බන්ධිකරණ ඒකකය
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

සුළු ප්‍රසම්පාදන කමිටුව
(රුපියල් මිලියන 10 දක්වා)

- සභාපති
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- කළමනාකරු (තත්ව පාලන)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

ත්‍රිපෝෂ ආයතනයේ ඉතිහාසය හා වර්තමාන ප්‍රගතිය

ත්‍රිපෝෂ ආයතනයේ කළමනාකරණ කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයට 1976 වර්ෂයේ දී පැවරුණි. කළමනාකරණ කාර්යයන් සඳහා ටෙන්ඩර් කැඳවන ලද අතර, ඒ සඳහා ලංකා දුම්කොළ සමාගම තෝරා ගනු ලැබී ය. එතැන් සිට 2010 වර්ෂය දක්වා ම මෙහි පාලන කටයුතු ලංකා දුම්කොළ සමාගම විසින් සිදු කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දායකත්වය වඩාත් ළං කරමින් ත්‍රිපෝෂ කර්මාන්ත ශාලාවේ නඩත්තු වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ කටයුතු 1987 වර්ෂයේ සිට සිදු විය. එමෙන්ම ත්‍රිපෝෂ කර්මාන්තශාලාව සතු භූමි භාගය යන්ත්‍රෝපකරණ හා අනෙකුත් සම්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් විය.

රටේ මන්දපෝෂණය තුරන් කරලීමේ ජාතික වැඩසටහන වඩාත් බලගතු කිරීමේ අරමුණින් ත්‍රිපෝෂ ආයතනය රජයට පවරාගෙන එහි නිෂ්පාදන වැඩි දියුණු කිරීමට රජයේ අවධානය යොමු විය. එවක සිටි සෞඛ්‍ය අමාත්‍ය, වර්තමාන ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු 2010.09.17 දින සිට පූර්ණ රාජ්‍ය සමාගමක් ලෙසින් මෙම ත්‍රිපෝෂ ආයතනය "ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්" නමින් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත විය. අංක පී.බී./3873 යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයක් ලෙසින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යටතේ නව සමාගම ලියාපදිංචි කරන ලදි. ඉන්පසු 2011.01.07 දින සිට සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විත නව කළමනාකරණ මණ්ඩලයක් යටතේ ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් හි කටයුතු ආරම්භ විය.

නිෂ්පාදන ප්‍රගතිය

2011 වර්ෂයේ රජයට පවරා ගන්නා අවස්ථාවේදි ශ්‍රී ලංකාව තුළ ත්‍රිපෝෂ ලැබීමට හිමිකම ඇති සම්පූර්ණ මසක ප්‍රතිලාභීන් සංඛ්‍යාව 928,000ක් වේ. මෙම ප්‍රතිලාභීන්,

- සියලු ම ගර්භනී මව්වරුන්
- සියලු ම කිරිදෙන මව්වරුන් (ළදරුවාට මාස 06ක් ගත වනතුරු)
- මන්ද පෝෂණයෙන් පෙළෙන මාස 06ට වැඩි ළදරුවන් සහ අවුරුදු 05ට අඩු පෙර පාසල් ළදරුවන්
- බර අනුව ළමා වර්ධක සටහනේ 3වන ශතක රේඛාවට පහළින් සිටින ළමුන්
- ඉහත කාණ්ඩයට අයත් රෝහල්ගත රෝගීන් යන අයගෙන් සමන්විත වේ.

ඉහත කී ත්‍රිපෝෂ ප්‍රතිලාභීන් වෙත සම්පූර්ණයෙන් මසකට අවශ්‍ය ත්‍රිපෝෂ සැපයීමට මසකට ත්‍රිපෝෂ මෙ.ටො. 1,392ක් නිෂ්පාදනය කළ යුතු වේ. 2010 සැප්තැම්බර් මාසය දක්වා ත්‍රිපෝෂ ආයතනය රජයට පවරා ගැනීමට පෙර මසක නිෂ්පාදනය මෙ.ටො. 1,000ක් විය. 2010 සැප්තැම්බර් මස සමාගම රජයට පවරා ගැනීමත් සමග නිෂ්පාදනයේ විශාල වැඩිවීමක් සිදු විය. නවීන යන්ත්‍රසූත්‍ර ස්ථාපනය හා සේවක දිරි ගැන්වීම් ආදිය මෙම නිෂ්පාදන ඉහළ යාමට හේතු විය. ඒ අනුව 2011 නොවැම්බර් මාසය වන විට මසක නිෂ්පාදනය මෙ.ටො. 1,300ක් දක්වා ඉහළ නැංවීමට හැකි වූ අතර, එය සම්පූර්ණ අවශ්‍යතාවයේ ප්‍රතිශතයක් ලෙසින් 93%කි.

දිවයිනේ 928,000ක් වූ සම්පූර්ණ ප්‍රතිලාභි අවශ්‍යතාවය සපුරාලීමට එනම් 100%ක ප්‍රතිශතයක් කරා ළඟා වීමට තවත් අවශ්‍යව පැවැතියේ මෙ.ටො. 92ක් පමණි. යුද්ධය නිම වීම නිසා සංවර්ධනයවන ප්‍රදේශවල ප්‍රතිලාභීන් ද ගණනය කිරීමෙන් පසු 2015 වර්ෂයේ මාසික ප්‍රතිලාභී සංඛ්‍යාව මිලියනයක් බවට ගණන් බලා ඇති අතර, ඒ සඳහා මසක නිෂ්පාදන අවශ්‍යතාවය මෙ.ටො. 1,512ක් වනු ඇත. මෙම අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම වාර්තමාන ඉලක්කය වේ. රජයේ වැඩපිළිවෙල යටතේ ත්‍රිපෝෂ නිෂ්පාදන අවශ්‍යතාවය 100%ක් කරා ළඟා වීමට 2015 වනවිට මිලියනයක් වූ සම්පූර්ණ ප්‍රතිලාභීන් සඳහා මසකට අවශ්‍ය වන ත්‍රිපෝෂ මෙ.ටො. 1,512ක් නිෂ්පාදනය කිරීම ඉතා පහසු ඉලක්කයක් වනුයේ පහත සඳහන් වැඩි දියුණු කිරීම් මේවනවිටත් නිම වෙමින් පවතින නිසා ය.

ඉලක්ක සපුරා ගැනීම සඳහා දියත් කර ඇති වැඩපිළිවෙල

ත්‍රිපෝෂ නිෂ්පාදනය දෙගුණ කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර ඇතුළු අනෙකුත් වත්කම් මිල දී ගැනීමට මහා භාණ්ඩාගාරය විසින් සෘජුව ත්‍රිපෝෂ සමාගම වෙත රුපියල් මිලියන 200ක් ලබා දීමට එකඟ වී තිබීම සහ ඉන් මිලියන 44ක් මේවනවිට වෙන් කර දී ඇති අතර, යන්ත්‍ර මිල දී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම.

නව යන්ත්‍රසූත්‍ර සවි කිරීමෙන් පසු ත්‍රිපෝෂ නිෂ්පාදනය දෙගුණ කිරීමට බලාපොරොත්තු වනු ඇත. ඉන් පසු 2015 වර්ෂයේ මිලියනයක් වූ සම්පූර්ණ ප්‍රතිලාභීන් සංඛ්‍යාව වෙත ත්‍රිපෝෂ ලබා දීමට හැකි වනු ඇත. මුළු රටේ ම ත්‍රිපෝෂ ප්‍රතිලාභීන්ට අවශ්‍ය ත්‍රිපෝෂ ලබා දී අතිරික්තය දේශීය වෙළඳපොළට නිකුත් කිරීම ආයතනයේ මීළඟ ජයග්‍රාහී ඉලක්කය වනු ඇත.

මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවා ගණන, තනතුරු හා අනුමත සේවක සංඛ්‍යාව

01.	ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්		
	• ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්)	01	
	• ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති)	01	02
02.	මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්		
	• කළමනාකරු (ඉංජිනේරු හා නිෂ්පාදන සේවා)	01	
	• කළමනාකරු (තත්ත්ව පාලන)	01	
	• කළමනාකරු (මුදල්)	01	03
03.	කනිෂ්ඨ කළමනාකරුවන්		
	• බෙදාහැරීමේ නිළධාරි		
	• අභ්‍යන්තර විගණක නිළධාරි	01	
	• මුදල් නිළධාරි	01	
	• සැපයීම් නිළධාරි	01	
	• ගුදම් ගබඩා නිළධාරි	01	
	• නිෂ්පාදන නිළධාරි	01	
	• පරිපාලන නිළධාරි	01	
	• ගබඩා නිළධාරි	01	
	• ගිණුම් නිළධාරි	01	
		01	09
04.	කළමනාකරණ සහකාර (තාක්ෂණ)		03
05.	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)		14
06.	ප්‍රාථමික සේවා		
	ප්‍රාථමික සේවා (ශිල්පීය)		
	• රියදුරු	06	
	• විදුලි කාර්මික	03	09
ප්‍රාථමික සේවා (අර්ධ ශිල්පීය)			
	• බොයිලේරුකරුවන්	03	
	• පීටර්වරුන්	03	
	• ලේත් යන්ත්‍රකරුවන්	02	
	• යන්ත්‍ර ක්‍රියාකරු	22	
	• තත්ත්ව පරීක්ෂක	07	
	• ගිනි නිවීමේ උපස්ථායක	01	38
ප්‍රාථමික සේවා (ශිල්පීය නොවන)			
	• උද්‍යානකරු	02	
	• කම්කරු/කාර්යාල සහායක	02	
	• සාමාන්‍ය කම්කරු	111	
	• කම්කරු පාලිකා	01	116
එකතුව			194

අපගේ කණ්ඩායම සේවා අනුව විහිදී ඇති ආකාරය මෙසේය

- නිෂ්පාදනාගාරය
  (කණ්ඩායමට ඇතුළත් පිරිස 170)

	තනතුරු	සංඛ්‍යාව	
01.	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්)	01	
02.	කළමනාකරු (ඉංජිනේරු සේවා හා නිෂ්පාදන)	01	
03.	කළමනාකරු (තත්ත්ව ආරක්ෂක)	01	
04.	ගුදම් ගබඩා නිළධාරී	01	
05.	නිෂ්පාදන නිළධාරීන්	03	
06.	ගබඩා නිළධාරීන්	02	
07.	බෙදාහැරීමේ නිළධාරීන්	01	
08.	කළමනාකරණ සහාකාරවරුන්	07	
09.	විදුලි කාර්මිකයින්	03	
10.	ගිනි නිවීමේ උපස්ථායකයින්	01	
11.	තත්ත්ව පරීක්ෂකයින්	07	
12.	යන්ත්‍ර ක්‍රියාකරුවන්	22	
13.	ලේත් යන්ත්‍රකරුවන්	02	
14.	පිටර්වරුන්	03	
15.	බොයිලේරුකරුවන්	03	
16.	සාමාන්‍ය කම්කරුවන්	112	
			170

- පරිපාලන, ගිණුම් හා වෙනත් අංශ
  (කණ්ඩායමට ඇතුළත් පිරිස 24)

	තනතුරු	සංඛ්‍යාව	
01.	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති)	01	
02.	කළමනාකරු (මුදල්)	01	
03.	මුදල් නිළධාරී	01	
04.	ගිණුම් නිළධාරී	01	
04.	අභ්‍යන්තර විගණන නිළධාරී	01	
05.	පරිපාලන නිළධාරී	01	
06.	සැපයුම් නිළධාරී	01	
07.	කළමනාකරණ සහාකාරවරුන්	07	
08.	රියදුරන්	06	
09.	කාර්යාල සහායක	02	
10.	උද්‍යානකරු	02	
			24
එකතුව			194

2015 වර්ෂයේ සැපයුම්කරුවන් පිළිබඳ විස්තර

සෝයා බෝංචි හා බඩඉරිඟු

1. ගොවි මධ්‍යස්ථානය
   මිගලෑව
   නො: 367
   03 මහළ ඩැම් වීදිය
   කොළඹ 12

2. එස්. ඩී. කේ. යුනයිටඩ් ඇග්‍රිවෙන්චස් (ප්‍රයිවට්) ලිමිටඩ්
   පන්ඩුලගම
   අනුරාධපුර

3. ඒකාබද්ධ ගොවි සංවිධානය
   අම්පාර
   නො: 169, දුටු ගැමුණු මාවත
   පෑලියගොඩ

4. කේ. එස්. ටී. එවර්ග්‍රීන් (ප්‍රයිවට්) ලිමිටඩ්
   නො: 583
   සාන්ත ජුඩ් මාවත
   රිලවුල්ල
   කඳාන

5. සී. අයි. සී. සීඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
   නො : 205 1/1
   ඩී.ආර්. විජේවර්ධන මාවත
   කොළඹ 10

01. කිරි පිටි
    මිල්කෝ සමාගම
    නො: 45
    නාවල පාර
    නාරාහේන්පිට

02. විටමින්
    ජේ.කේ. ට්‍රේඩ්ලින්ක් (ප්‍රයිවට්) ලිමිටඩ්
    නො: 44
    තලවතුගොඩ පාර
    පිටකෝට්ටේ

03. මිනරල්
    වික්‍රමරත්න පුද්ගලික සමාගම
    නො: 231
    ඩැම් වීදිය
    කොළඹ 12

04. ක්‍රාෆ්ට් පෙපර්
    අබ්දුල්ලා ඉන්ඩස්ට්‍රීස් පැකේජින් (ප්‍රයිවට්) ලිමිටඩ්
    නො: 72
    මහ විද්‍යාල මාවත
    කොළඹ 13

05. පොලිතින්
    නිව් ජීවා ඉන්ඩස්ට්‍රි (ප්‍රයිවට්) ලිමිටඩ්
    පොල්වත්ත
    කුන්ඩසාලේ
    මහනුවර

2011 වසරේ සිට 2015 වසර දක්වා ත්‍රිපෝෂ නිෂ්පාදනය (මාස්ටර් බැග්ස්)

මාසය	2011	2012	2013	2014	2015
ජනවාරි	41,752	37,689	43,026	40,316	47,901
පෙබරවාරි	45,161	47,414	44,109	47,708	43,679
මාර්තු	48,028	47,198	44,701	56,917	53,206
අප්‍රේල්	37,573	30,336	22,018	38,492	42,176
මැයි	48,002	43,425	30,069	56,456	57,367
ජූනි	37,860	45,936	33,370	51,654	53,393
ජූලි	38,090	45,736	60,285	57,309	61,000
අගෝස්තු	47,810	47,236	55,429	57,677	57,719
සැප්තැම්බර්	50,428	44,645	58,712	57,621	60,182
ඔක්තෝබර්	56,913	48,009	49,958	58,522	62,381
නොවැම්බර්	51,026	15,308	42,348	56,324	60,908
දෙසැම්බර්	10,304	37,520	18,238	42,072	48,633
මාස්ටර් බැග්ස්	512,947	490,452	502,263	621,068	648,545
මෙට්‍රික් ටොන්	11,541	11,035	11,300	13,974	14,592

2011 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බැග්ස්)



2012 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බෑග්ස්)



2013 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බෑග්ස්)



2014 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බැග්ස්)



2015 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බැග්ස්)



ඉහත තොරතුරු අනුව වසර 40ක තරම් වන නිෂ්පාදන ඉතිහාසයේ වැඩිම වාර්ෂික නිෂ්පාදනය 2015 වර්ෂයේ වාර්තා වූ අතර එය ත්‍රිපෝෂ මාස්ටර් බැග් 648,545කි.

2016 අපේක්ෂිත ඉලක්ක

දැනට ක්‍රියාත්මක වන ඇන්ඩර්සන් යන්ත්‍රයේ ධාරිතාවය මෙන් ධාරිතාවය දෙගුණයක් වන නව ඇන්ඩර්සන් යන්ත්‍රයක් ස්ථාපිත කර ත්‍රිපෝෂ නිෂ්පාදනය වැඩිකර අතිරික්තය වෙළඳපොළට අලෙවි කිරීම ත්‍රිපෝෂ සමාගමේ කළමනාකාරිත්වයේ සහ සේවක මණ්ඩලයේ ඉලක්කය වේ.

තවද මෙම නිෂ්පාදනයන් ඉතා කාර්යක්ෂම ලෙස ඇසුරුම් කිරීම සඳහා ඇසුරුම් යන්ත්‍ර තුනක් මිලදී ගැනීමද අතිරික්ත නිෂ්පාදනය හා බැඳුනු තවත් ඉලක්කයක් වන්නේය.

2015 සහ 2016 වර්ෂයන් වල නිෂ්පාදන ප්‍රවර්ධනය පහත අයුරින් ඉහළ නැංවීම ආයතනයේ ඒකායන අපේක්ෂාවයි. එවිට ප්‍රතිලාභි අවශ්‍යතා අනුව බෙදාහැරීමේ හැකියාව ලබා ගනු ඇත.

මාසය	2015		2016	
	මාස්ටර් බැග්ස්	පැකට්ස්	මාස්ටර් බැග්ස්	පැකට්ස්
ජනවාරි	57,012	1,710,360	67,596	2,027,800
පෙබරවාරි	51,972	1,559,160	67,596	2,027,880
මාර්තු	60,036	1,801,080	70,476	2,114,280
අප්‍රේල්	57,348	1,720,440	53,556	1,606,680
මැයි	63,060	1,891,800	67,596	2,027,880
ජුනි	60,036	1,801,080	61,476	1,844,280
ජුලි	60,036	1,801,080	67,596	2,027,880
අගෝස්තු	60,372	1,811,160	72,996	2,189,880
සැප්තැම්බර්	60,036	1,801,080	70,116	2,103,480
ඔක්තෝබර්	62,724	1,881,720	70,476	2,114,280
නොවැම්බර්	60,372	1,811,160	66,876	2,006,280
දෙසැම්බර්	57,348	1,720,440	63,996	1,919,880
එකතුව	710,352	21,310,560	800,352	24,010,560

දත්ත හා තොරතුරු

ත්‍රිපෝෂ නිෂ්පාදනය, බෙදාහැරීම හා අළෙවිය පිළිබඳ දත්ත ක්ෂණිකව හා පහසුවෙන් ලබාගත හැකි පරිදි මෘදුකාංග (Software) ස්ථාපිත කිරීම වැදගත් වන බැවින් ඉදිරියේ දී එය සිදු කිරීමට නියමිත ය.

නිෂ්පාදන අමුද්‍රව්‍ය තව තවත් මිල දී ගැනීම

දේශීය ගොවියා තව තවත් සුරක්ෂිත කිරීමේ අරමුණ පෙරදැරිව ඔවුන්ගේ නිෂ්පාදන ගොවි සංවිධාන වෙතින් ත්‍රිපෝෂ ආයතනයට සපයා ගැනීමට තව දුරටත් කටයුතු කරනු ඇත. මේ අනුව මීගලෑව, අනුරාධපුරය, අම්පාර හා හුරුළුවැව ගොවි සංවිධාන මගින් සෝයා බෝංචි හා බඩඉරිඟු නිෂ්පාදන ලබා ගැනීම නිසා එම ගොවි සංවිධාන හා අනුබද්ධ 8,000ක පමණවන මහවැලි හා පාරම්පාරික ගොවි පවුල්වලට සෘජුවම ආයතනය හා සම්බන්ධ වීමේ හැකියාව ලැබෙනු ඇත. මේ සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකු, ප්‍රධාන වාණිජ බැංකු මගින් අදාළ ගොවි සංවිධානවලට අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයනු ඇත.

ත්‍රිපෝෂ බෙදා හැරීමේ ක්‍රියාවලිය

ත්‍රිපෝෂ කර්මාන්ත ශාලාව (ජා-ඇල)

↓

බෙදාහැරීමේ කටයුතු කිරිම (ලොරි රථ මගින් හා දුම්රිය වැගන් මගින්)

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් → සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී → සෞඛ්‍ය මධ්‍යස්ථාන (සායන) → පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය

වතු

ළමා මධ්‍යස්ථාන

ත්‍රිපෝෂ ප්‍රතිලාභීන්

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම මගින් ත්‍රිපෝෂ නිෂ්පාදනය සිදු කර සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා ක්‍රමානුකූලව බෙදාහැරීම් කටයුතු සිදු කරනු ලැබේ.

ත්‍රිපෝෂ බෙදාහැරීමේ මධ්‍යස්ථාන

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ

1. මධ්‍යම පළාත
2. නැගෙනහිර පළාත
3. උතුරු මැද පළාත
4. වයඹ පළාත
5. උතුරු පළාත
6. සබරගමුව පළාත
7. දකුණු පළාත
8. ඌව පළාත
9. බස්නාහිර පළාත

වතු අධිකාරි

1. හැටන්
2. මාතලේ
3. කෑගල්ල
4. මහනුවර
5. කළුතර
6. නුවර එළිය
7. මාතර
8. බදුල්ල
9. ගාල්ල
10. රත්නපුර

වෙනත්

1. හමුදා රෝහල්
2. පොලිස් රෝහල්
3. ළදරු පාසල්
4. නගර සභා
   - මීගමුව
   - කොළඹ
   - මාතලේ
   - ගාල්ල
   - නුවර

පරිවාස හා ළමා ආරක්ෂණ අධිකාරි

1. අනුරාධපුරය
2. බත්තරමුල්ල
3. බදුල්ල
4. ගාල්ල
5. යාපනය
6. ත්‍රිකුණාමලය
7. කුරුණෑගල
8. රත්නපුර
9. කෑගල්ල
10. නුවර

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ

1. අම්පාර
2. අනුරාධපුරය
3. බදුල්ල
4. මඩකලපුව
5. කොළඹ
6. ගාල්ල
7. ගම්පහ
8. හම්බන්තොට
9. යාපනය
10. කල්මුණේ
11. කළුතර
12. රත්නපුර
13. ත්‍රිකුණාමලය
14. මහනුවර
15. කෑගල්ල
16. කිලිනොච්චිය
17. කුරුණෑගල
18. මාතලේ
19. මාතර
20. මන්නාරම
21. මොණරාගල
22. නුවර එළිය
23. පොළොන්නරුව
24. පුත්තලම
25. වව්නියාව

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ ගනන

1. අම්පාර	07	10. කල්මුණේ	13	19. මාතර	16
2. අනුරාධපුරය	18	11. කළුතර	13	20. මන්නාරම	03
3. බදුල්ල	15	12. රත්නපුර	17	21. මොණරාගල	11
4. මඩකලපුව	13	13. ත්‍රිකුණාමලය	10	22. නුවර එළිය	11
5. කොළඹ	11	14. මහනුවර	21	23. පොළොන්නරුව	07
6. ගාල්ල	19	15. කෑගල්ල	11	24. පුත්තලම	11
7. ගම්පහ	16	16. කිලිනොච්චිය	04	25. වව්නියාව	04
8. හම්බන්තොට	12	17. කුරුණෑගල	23		
9. යාපනය	11	18. මාතලේ	12		

2015 වර්ෂයේ ත්‍රිපෝෂ බෙදා හැරීමේ තොරතුරු

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ	ප්‍රතිලාභින් සංඛ්‍යාව	මසකට වෙන් කරනු ලබන ප්‍රමාණය (මළු)		
		මව්වරුන්ට	ළමයින්ට	එකතුව
අම්පාර	26,542	574	1,190	1,764
අනුරාධපුරය	56,410	1,251	2,513	3,764
බදුල්ල	41,461	927	1,837	2,764
මඩකලපුව	43,405	960	1,932	2,892
කොළඹ රෝහල	4,848	68	256	324
කොළඹ නගර සභාව	9,240	221	405	626
කොළඹ (දකුණ)	44,513	975	1,991	2,966
ගාල්ල	47,365	1,048	2,109	3,157
ගම්පහ	51,159	1,158	2,253	3,411
හම්බන්තොට	34,758	776	1,542	2,318
යාපනය	31,010	689	1,408	2,097
කල්මුණේ	37,706	835	1,678	2,513
කළුතර	34,317	770	1,520	2,290
මහනුවර	59,458	1,320	2,646	3,966
කෑගල්ල	30,288	1,031	990	2,021
කිලිනොච්චිය	7,719	172	342	514
කුරුණෑගල	66,798	1,471	2,983	4,454
මන්නාරම	7,398	163	330	493
මාතලේ	31,158	623	1,460	2,083
මාතර	50,695	1,117	2,264	3,381
මොණරාගල	29,517	657	1,310	1,967
නුවරඑළිය	26,798	540	1,245	1,785
පොළොන්නරුව	32,367	625	1,534	2,159
පුත්තලම	27,857	661	1,197	1,858
රත්නපුර	42,555	957	1,881	2,838
ත්‍රිකුණාමලය	40,884	905	1,819	2,724
වව්නියාව	8,290	186	368	554
මුලතිව්	6,335	141	281	422
එකතුව	930,851	20,821	41,284	62,105

පරිවාස ළමා රක්ෂණ මධ්‍යස්ථාන	ප්‍රතිලාභින් සංඛ්‍යාව	මසකට වෙන් කරනු ලබන ප්‍රමාණය (මළු)
09	22,692	6,051
එකතුව	22,692	6,051

වතු ප්‍රදේශ	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මසකට වෙන් කරනු ලබන ප්‍රමාණය (මළු)		
		මව්වරුන්ට	ළමයින්ට	එකතුව
හැටන්	10,655	689	1,435	2,124
මාතලේ	2,888	178	400	578
කෑගල්ල	4,387	257	620	877
මහනුවර	5,334	332	735	1,067
කළුතර	2,559	166	346	512
නුවර එළිය	11,595	756	1,563	2,319
මාතර	1,077	70	145	215
බදුල්ල	10,340	703	1,365	2,068
ගාල්ල	1,110	69	153	222
රත්නපුර	4,743	310	638	948
එකතුව	54,688	3,530	7,400	10,930

2015 වර්ෂයේ ත්‍රිපෝෂ බෙදාහැරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව හා ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව

	මධ්‍යස්ථාන සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාස 28 වෙනුවෙන්	740	930,851
වතු	447	54,688
පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තුවේ ළමා නිවාස	09	22,692
එකතුව	1,196	1,008,231

අවසන් ඉලක්කය

මෙම අවශ්‍යතා සපුරාගෙන අවශ්‍ය වැඩි දියුණු කිරීම් ඉදිරි කෙටි කාලය තුළ සම්පූර්ණ වන අතර, මිලියනයකට ආසන්න වූ සම්පූර්ණ ප්‍රතිලාභින් සංඛ්‍යාව වෙත නොඅඩුව ත්‍රිපෝෂ ලබාදීමට 100%ක ඉලක්කය කරා ළඟා වීම අවසන් ඉලක්කය වනු ඇත.
එමෙන්ම අතිරික්ත නිෂ්පාදනයක් ඇති කිරීම අපේක්ෂා කරනු ලබන අතර එම අතිරික්තය නව මුහුණුවරකින් වෙළඳපලට හඳුන්වාදි වෙළඳපල ඉල්කක ජය ගැනිමද තවත් එක් අභිප්‍රායකි.

මේ අනුව රටේ ප්‍රතිලාභි අවශ්‍යතාවන්ට සරිලන නිෂ්පාදන මට්ටම මේ අයුරින් වැඩි දියුණු කොට යහපත් සේවා තත්ත්වයක් පවත්වාගෙන යෑම සහ වෙළඳපලට නිෂ්පාදනය හඳුන්වාදි ලාභ ලබන රාජ්‍ය සමාගමක් බවට පත් කිරීම ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් හී අපේක්ෂාව වන්නේ ය.

2015 වර්ෂය තුළ අත්කරගත් ජයග්‍රහණ හා මුහුණ දීමට සිදු වූ ගැටළු

2014 වර්ෂය තුළ අත් කරගත් ජයග්‍රහණයක් වන්නේ මන්දපෝෂණය රටින් තුරන් කිරිමේ අපගේ මුලික පරමාර්ථය සාර්ථක කර ගැනීමට හැකි වීමයි. එනම්, ත්‍රිපෝෂ බෙදාහැරීම තුළින් අනෙක් වර්ෂවලට සාපේක්ෂව මන්දපෝෂණ තත්ත්වය අඩු වී තිබීමයි. උදාහරණයක් ලෙස මොණරාගල දිස්ත්‍රික්කයේ මන්දපෝෂණ ප්‍රතිශතය අඩු වී ඇති බව නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය මගින් අප වෙත දැනුම් දෙන ලදි.

සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා

1. ක්‍රමවත් බෙදාහැරීමේ ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීමේ පහසුව තකා අප ආයතනයට ලොරි රථයක්,

2. ත්‍රිපෝෂ බෙදාහරිනු ලබන ආයතන නිරීක්ෂණය සඳහා නිරීක්ෂණ කමිටුවක් පිහිටුවීම ඉතා වැදගත් ය.

2015 වසරේ අප ලද නිෂ්පාදන ජයග්‍රහණ

ත්‍රිපෝෂ නිෂ්පාදන ඉතිහාසයේ ඉහළම නිෂ්පාදනය අත්පත් කර ගැනීමට අපට හැකි විය.

ජයග්‍රහණයේ පසුබිම

- කණ්ඩායමක් ලෙස එක්ව වැඩ කිරීම
- නවීන යන්ත්‍ර අළුතින් භාවිතයට ගැනීම
- වැඩ පිළිබඳ ආකල්ප වැඩිදියුණු කිරීමට

ප්‍රතිඵල

- වර්ෂයේ ඉහළම නිෂ්පාදන
- මාසික ඉහළම නිෂ්පාදන
- දෛනික ඉහළම නිෂ්පාදන

අපගේ මීළඟ ඉලක්කය වෙළඳපොළ ජයගැනීමයි.
අපි එය ජය ගන්නෙමු

ස්තුතිය

අප දිරිමත් කරමින් නිරතුරු අපට මාර්ගෝපදේශකත්වය ලබා දුන් සෞඛ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාට, අපට නිරතුරු අවශ්‍ය සහය ලබා දුන් නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍ය ගරු ෆයිසල් කසීම් මැතිතුමාට, අප නිසි මගට යොමු කරමින් උපදෙස් ලබා දුන් සෞඛ්‍ය ලේකම් ගරු අනුර ජයවික්‍රම මැතිතුමාට සහ අපට වාර්ෂිකව අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් අතහිත දුන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ ලේකම් ගරු ආර්. එච්. එස්. සමරතුංග මැතිතුමාට අපගේ ස්තුතිය පුදකර සිටිමු.

එලෙසින්ම ආයතනයේ කළමනාකාරීත්වය දරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම මහත්ම, මහත්මීන්ගෙන් ලද සහාය අප සැමට ආශිර්වාදයක්ම විය. එමෙන්ම අපගේ සැපයුම්කරුවන් හා බාහිරව අපට සේවය සලසන සැම කෘතඥ පූර්වකව සිහිපත් කරමු.

අපගේ ආයතනයේ ඉහළ සිට පහළටත්, පහළ සිට ඉහළටත් ගලා යන ධුරාවලින් තෘප්තිමත්ව සේවය කරන කාර්ය මණ්ඩලයක් දක්නට ලැබීම මහත් සතුටකි. ආයතනයේ දියුණුවට ඔවුන් ලබා දෙන දායකත්වය අගේ කළ යුතුය. අවසන් වශයෙන් මෙම ඉලක්ක ජය ගැනීමට නිරතුරු වෙහෙසෙන ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි සමස්ත කාර්ය මණ්ඩලයට ප්‍රණාමය පුදකර සිටිමු.

83/1/2, සුභද්‍රාරාම මාවත,
ගංගොඩවිල, නුගේගොඩ, ශ්‍රී ලංකාව.
දුරකථන අංක : +94 11 2822 164
ෆැක්ස් අංක : +94 11 2372317
ජංගම දුරකථන අංක : +94 71 6840 945
විද්‍යුත් තැපැල : krc@krathnasinghe.com
වෙබ් අඩවිය : www.krathnasignhe.com

කපිල රත්නසිංහ සහ සමාගම
(වරලත් ගණකාධිකාරිවරුන්)

ස්වාධීන විගණන වාර්තාව

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි කොටස් හිමිකරුවන් වෙත

2015 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශය, කොටස් හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සුවිශේෂි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා වෙනත් විස්තර කිරීමේ සටහන්හි සාරාංශයක් ද ඇතුලත්ව, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් සමාගම හා සම්බන්ධ මේ සමග ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරනු ලැබ ඇත්තෙමු.

මූල්‍ය ප්‍රකාශය සඳහා මණ්ඩලය සතු වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය සහ සාධාරණ මතයක් ඉදිරිපත් කළ යුතු සහ වංචාවකින් හෝ අත්වැරදීමකින් හෝ ප්‍රධාන පෙළේ සාවද්‍ය ලෙස ප්‍රකාශගත කිරීමක් සිදු නොවන අයුරින් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට අවශ්‍ය යැයි මණ්ඩලය නිර්ණය කරනු ලබන කල්හි එවැනි අභ්‍යන්තර පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය (මණ්ඩලයම) විසින් මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමෙහි ලා වග කිව යුතු වේ.

විගණකවරුගේ වගකීම

අපගේ විගණනය මත පදනම්ව, මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අදහසක් ඉදිරිපත් කිරීම අපගේ වගකීම වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවන්ට අනුව අප විසින් අපගේ විගණනය සිදු කරනු ලැබූ අතර, අප විසින් ආචාරධර්ම හා අනුගතව ක්‍රියා කරනු ලබන අතර, මෙම මූල්‍ය ප්‍රකාශ ප්‍රධාන පෙළේ සාවද්‍ය ලෙස ප්‍රකාශගත කිරීම්වලින් තොර වේද යන්න පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා ගැනීම පිනිස සැලසුම් සකස් කර, විගණනය සිදු කරනු ලැබේ.

විගණන කාර්යයක්, මූල්‍ය ප්‍රකාශයන්හි වටිනාකම් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදවලින් සමන්විත වේ. විගණකවරුන්ගේ නිශ්චය කිරීම මත තෝරා ගනු ලබන ක්‍රමවේද තිරණය කෙරෙනු ලබන අතර, ඊට
වංචාවකින් හෝ අත්වැරදීමකින් හෝ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන පෙළේ සාවද්‍ය ලෙස ප්‍රකාශගත කිරීමේ අවදානම් ඇගයීම ඇතුලත් වේ. එම අවදානම් ඇගයීම් සකස් කිරීමේදී, ආයතනයේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනය විගණකවරයා විසින් සලකා බලනු ලබන අතර, එමඟින් අවස්ථාවට යෝග්‍ය පරිදි විගණන ක්‍රමවේද සැලසුම් කිරීම පිණිස, සත්‍ය සහ සාධාරණ මතයක් ඉදිරිපත් කළ යුතු නමුත්, ආයතනයේ අභ්‍යන්තර පාලනයෙහි ඵලදායිත්වය පිළිබඳව අදහසක් පළ කිරීම අරමුණුගත නොවේ. භාවිත කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි යෝග්‍යතාව සහ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරූය බව මෙන්ම මූල්‍ය ප්‍රකාශයන්හි සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීම ද විගණනයක් තුළ අන්තර්ගත වේ.

අපගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම පිණිස, අප විසින් ලබා ගත් විගණනෙ සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අපි විශ්වාස කරන්නෙමු.

මතය

අපගේ මතයට අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන මගින් 2015 දෙසැම්බර් 31 දිනට අවසන් සමාගමේ මූල්‍ය තත්ත්වයේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුගතව, ඉන් පසු අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙයි.

වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතෙහි 163(2) වගන්තියෙහි දක්වා ඇති පරිදි, අප විසින් පහත සඳහන් කරුණු ප්‍රකාශ කර සිටිමු :

(අ) අදහස් ඉදිරිපත් කිරීමේ පදනම සහ විගණනයේ විෂය පථය සහ සීමාවන් පහත සඳහන් පරිදි වේ.

(ආ) අපගේ මතයට අනුව,

- ➢ විගණනය සඳහා අවශ්‍ය වූ සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් අප විසින් ලබා ගෙන ඇති අතර, බාහිර පරීක්ෂණවලින් පෙනී යන පරිදි, සමාගම විසින් නිසියාකාරව ගිණුම් වාර්තාගත කිරීම් පවත්වා ගෙන යනු ලැබ ඇත.
- ➢ සමාගමේ මූල්‍ය ප්‍රකාශන මගින් 2015 දෙසැම්බර් 31 දිනට අවසන් සමාගමේ මූල්‍ය තත්ත්වයේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුගතව, ඉන් පසු අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙයි.
- ➢ සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතෙහි 151 වගන්තියේ දක්වා ඇති අවශ්‍යතා හා අනුකූල වේ.

වරලත් ගණකාධිකාරිවරුන්
කොළඹ
දිනය : 2017 අප්‍රේල් මස 07 වන දින

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

ආදායම් හා වියදම් ප්‍රකාශය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2015.12.31 රු. ශත.	2014.12.31 රු.
වර්ෂය තුළ වියදම් ප්‍රතිපූර්ණය කිරීම	02	**1,776,421,902.86**	1,776,560,232
අඩු කළා : නිෂ්පාදන පිරිවැය	03	**(1,793,195,367.32)**	(1,604,546,992)
		(16,773,464.46)	172,013,239
එකතු කළා : වෙනත් ආදායම්	04	**25,779,714.43**	21,087,872
		9,006,249.97	193,101,111
අඩු කළා : වියදම්			
පරිපාලන වියදම්		**(36,103,900.98)**	(36,360,371)
බෙදාහැරීමේ පිරිවැය		**(11,119,781.08)**	(7,232,959)
මූල්‍ය සහ වෙනත් වියදම්		**(3,272,031.49)**	(1,311,290)
		(50,495,713.55)	(44,904,620)
වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම	05	**(41,489,463.58)**	148,196,491
වෙනත් විස්තිරණ ආදායම්			
විශ්‍රාමික ප්‍රතිලාභ හිමිකම නැවත හැරවීම		-	411,928
වර්ෂය සඳහා මුළු විස්තිර්ණ ආදායම		**(41,489,463.58)**	148,608,419

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉතා වැදගත් කොටසක් වන පිටු අංක 6 සිට 21 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශ සඳහා සිදු කරන ලද සටහන් හා එක්ව ඉහත සඳහන් විස්තිර්ණ ආදායම් ප්‍රකාශය කියවනු ලැබිය යුතුය.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
2015 දෙසැම්බර් 31 දිනට

	සටහන්	2015.12.31 රු. ශත.	2014.12.31 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ	06	435,918,034.29	423,481,345
අස්පෘශ්‍ය වත්කම්		661,187.57	-
		436,579,221.86	423,481,345
ජංගම වත්කම්			
වට්ටෝරු භාණ්ඩ	07	228,273,117.84	285,308,428
වෙළඳ සහ වෙනත් ලැබිම් නියමිත	08	134,547,130.68	43,877,617
ආයෝජන	09	90,251,730.77	60,200,275
මුදල් හා මුදල් සමාන දෑ	10	53,922,992.19	7,461,286
		506,994,971.48	396,847,606
මුළු වත්කම්		943,574,193.34	820,328,950
කොටස් හිමිකම් හා බැරකම්			
ප්‍රාග්ධනය හා සංචිත			
ප්‍රාග්ධන සංචිත	12	307,575,083.51	136,873,127
ප්‍රත්‍යාගණන සංචිත	13	307,170,027.56	307,170,028
වියදම ඉක්මවූ සමුච්චිත ආදායම		261,223,489.14	302,676,083
මුළු කොටස් හිමිකම්		875,968,600.21	746,719,238
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳිම්	14	29,593,685.00	28,130,680
වෛද්‍යාධාර අරමුදල	15	241,489.92	141,164
		29,835,174.92	28,271,844
ජංගම බැරකම්			
වෙළඳ සහ වෙනත් ගෙවීම් නියමිත	16	37,770,418.21	45,337,868
		37,770,418.21	45,337,868
මුළු කොටස් හිමිකම් හා බැරකම්		943,574,193.34	820,328,950

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉතා වැදගත් කොටසක් වන පිටු අංක 6 සිට 20 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සිදු කරන ලද සටහන් හා එක්ව ඉහත සඳහන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය කියවනු ලැබිය යුතුය.

මෙම මූල්‍ය ප්‍රකාශ, 2007 අංක 07 දරන සමාගම් පනතේ දක්වා ඇති නියමයන්ට අනුකූලව සකස් කරනු ලැබ ඇත.

....
මූල්‍ය ප්‍රධානි

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දැරිය යුතු වන්නේය.

මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අනුමත කර, අත්සන් තබන ලදී.

....
සභාපති

....
අධ්‍යක්ෂ

ජා ඇල, කපුවත්ත
දිනය : 2017 අප්‍රේල් මස 07 වන දින

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

කොටස් හිමිකම් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	ප්‍රාග්ධන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	වියදම ඉක්මවූ සමුච්චිත ආදායම	එකතුව
		රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.
2014.01.01 දිනට ශේෂය		152,382,926.66	307,170,027.56	154,060,207.30	**613,613,161.52**
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		7,913,121.28	-	-	**7,913,121.28**
ප්‍රාග්ධන සංචිතය වෙත මාරු කිරීම්		462,000.00	-	-	**462,000.00**
සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වත්කම් අදාළ ක්ෂය වීම්	17	(23,884,920.47)	-	-	**(23,884,920.47)**
පූර්ව වර්ෂයේ ගැළපුම්		-	-	7,457.01	**7,457.01**
2014 වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම		-	-	148,196,491.09	**148,196,491.09**
2014 වර්ෂයේ වෙනත් විස්තීර්ණ ආදායම්		-	-	411,927.50	**411,927.50**
2014.12.31 දිනට ශේෂය		136,873,127.47	307,170,027.56	302,676,082.90	**746,719,237.93**
2015.01.01 දිනට ශේෂය		136,873,127.47	307,170,027.56	302,676,082.90	**746,719,237.93**
ලද ප්‍රාග්ධන ප්‍රදාන		197,517,198.54	-	-	**197,517,198.54**
සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වත්කම් අදාළ ක්ෂය වීම්	17	(26,345,242.48)	-	-	**(26,345,242.48)**
පූර්ව වර්ෂයේ ගැළපුම්	18	(470,000.00)	-	36,869.82	**(433,130.18)**
2015 වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම		-	-	(41,489,463.58)	**(41,489,463.58)**
2015.12.31 දිනට ශේෂය		307,575,083.53	307,170,027.56	261,223,489.14	**875,968,600.23**

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2015.12.31 රු. ශත.	2014.12.31 රු.
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ		
වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම	**(41,489,464)**	148,608,419
ගැළපුම්		
පොලී ආදායම	**(3,599,383)**	-
වර්ෂය සඳහා පාරිතෝෂිත ප්‍රතිපාදන	**2,413,806**	(411,928)
පූර්ව වර්ෂ ගැළපුම්	**506,870**	-
වෛද්‍යාධාර දායකත්වය සඳහා ප්‍රතිපාදන	**173,968**	190,158
ක්ෂය වීම්	**26,345,242**	-
	25,840,504	(221,770)
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	**(15,648,960)**	148,386,649
කාරක ප්‍රාග්ධනයේ සිදුවූ වෙනස්කම්		
ණය ගැතියෝ සහ වෙනත් ලැබීම් නියමිතවල වැඩිවීම / (අඩුවීම)	**(90,669,514)**	(10,146,585)
වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිතවල වැඩිවීම / (අඩුවීම)	**(7,567,450)**	23,096,936
වට්ටෝරු භාණ්ඩ වැඩිවීම / (අඩුවීම)	**57,035,310**	(156,589,836)
	(41,201,653)	(143,639,484)
පාරිතොෂික ගෙවීමට පෙර මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**(56,850,614)**	4,747,165
අඩු කළා :		
ගෙවන ලද පාරිතෝෂිත	**(950,801)**	(1,543,740)
වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීම්	**(73,642)**	(111,789)
බදු ගෙවීමෙන් පසු මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**(57,875,057)**	3,091,636
ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහ		
දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ අත්කර ගැනිම	**(39,913,120)**	(7,913,121)
භාණ්ඩාගාර බිල්පත් ආපසු ගැනීම්	**60,000,000**	-
මුදලින් පොලී ලැබීම්	**3,547,927**	-
භාණ්ඩාගාර බිල්පත් අත් කරගැනිම	**(90,000,000)**	-
ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	**(66,365,193)**	(7,913,121)
මුල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ		
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	**170,701,956**	8,375,121
මුල්‍ය කටයුතු වලින් ලද දළ මුදල් ප්‍රවාහ	**170,701,956**	8,375,121
මුදල් හා මුදල් සමාන දෑ වෙනස්වීම්	**46,461,707**	3,553,636
මුදල් හා මුදල් සමාන දෑ ඉදිරියට ගෙන එන ලද්	**7,461,286**	3,907,650
මුදල් හා මුදල් සමාන දෑ ඉදිරියට ගෙන යන ලද්	**53,922,992**	7,461,286
මුල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති මුදල් සහ මුදල් සමාන දෑ හි විශ්ලේෂණය		
ලංකා බැංකුව, ජා-ඇල 71324617	**53,922,992**	7,461,286
	53,922,992	7,461,286

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1.1 වාර්තා කිරීමේ ආයතනය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්, පූර්ණ රජය සතු සමාගමක් ලෙස ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කර පිහිටුවා ඇති, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන සීමිත වගකීමක් සහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව, ජා ඇල, කපුවත්ත, තැ.පෙ. අංක 17 හි පිහිටා ඇත.

1.1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ත්‍රිපෝෂ බෙදාහැරීමේ වැඩසටහන සඳහා "ත්‍රිපෝෂ" නිෂ්පාදනය කරනු ලබන එකම සමාගම වනුයේ මෙම සමාගමයි.

සමාගමේ වෙනත් ප්‍රධාන කාර්යයන් වූයේ :

- ශ්‍රී ලංකාව තුළ මාතෘ සහ ළමා මන්දපෝෂණය අඩු කිරීම සඳහා ශක්ති වර්ධක ශ්‍රී ලාංකික අතිරේක ආහාර නිෂ්පාදිතයක් වන "ත්‍රිපෝෂ" වැඩිදියුණු කිරීම, නිෂ්පාදනය සහ බෙදාහැරීම පිණිස පහසුකම් සැලසීම.
- ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය සපයනු ලබන දේශීය ගොවීන් වෙත හැකි තාක් දුරට ආදායම් ජනනය වන මාර්ග සඳහා ධෛර්යමත් කිරීම.
- රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව, වෙනත් ආකාරයේ ශක්තිවර්ධක මිශ්‍ර කරන ලද ආහාර ද්‍රව්‍ය සඳහා පවතින වෙළඳපොළ අවම කිරීම.
- වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාව පිළිබඳව ඇගයීමක් සිදු කර, එය සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

1.1.3 අධ්‍යක්ෂ මණ්ඩලය

1. එම්. ඩී. බන්දුසේන මහතා (සභාපති)
2. වෛද්‍ය පාලිත ගුණරත්න මහිපාල මහතා
3. වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
4. එච්. එම්. තේජා හේරත් මහත්මිය
5. ඒ. ආර්. අහමඩ් මහත්මිය
6. වෛද්‍ය දමයන්ති හපුගොඩ මහත්මිය
7. බී. පී. චින්තක කුලරත්න මහතා
8. එස්. ආර්. රාජපක්ෂ මහතා (නිරීක්ෂක)

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
තනූජා ප්‍රියදර්ශනී අල්විස් මහත්මිය

1.1.4 විගණකවරුන්

කපිල රත්නසිංහ සහ සමාගම
(වරලත් ගණකාධිකාරිවරුන්)
83/1/2, සුභද්‍රාරාම මාවත, ගංගොඩවිල, නුගේගොඩ

1.1.5 බැංකුකරුවන්

ලංකා බැංකුව

1.1.6 නිකුත් කිරීම සඳහා බලයලත් දිනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ 2017 අප්‍රේල් මස 07 වන දිනැති යෝජනාවට අනුව, 2015 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම පිණිස අවසර ලබා දෙන ලදී.

1.1.7 සකස් කිරීමේ පදනම

අ. අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය

ගිණුම්කරණ ප්‍රතිපත්තින් සහ සටහන් (මූල්‍ය ප්‍රකාශය) සමඟ ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, සම කොටස්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලවය.

ආ. නිර්ණය කිරීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණය කිරීම් සිදු කරනු ලබන අවස්ථාවන්හිදී හැර, මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ ඇත.

ඇ. සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන කාලසීමාව තුළ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීමේ සහ අන්තර් කාලසීමා තුලනාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින්, එම මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පෙර වර්ෂයේ සියලුම වටිනාකම් සම්බන්ධයෙන් ගුණාත්මක, විස්තරාත්මක සහ ව්‍යක්ත තොරතුරු ඇතුලත් සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කරනු ලැබේ.

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, වෙනත් යම් අයුරකින් දක්වා ඇති අවස්ථාවකදී හැරුණු කොට, මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලුම කාලසීමාවන් සඳහා අඛණ්ඩව අදාළ කරගනු ලැබ ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත විෂයයන්හි ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය කිරීම සංශෝධනය කරනු ලැබ ඇති අවස්ථාවකදී, මනා ඉදිරිපත් කිරීමක් සිදු කිරීම පිණිස වත්මන් වර්ෂය හා අනුකූල වීම සඳහා සංසන්දනාත්මක වටිනාකම් ද නැවත වර්ගීකරණයට ලක් කරනු ලැබ ඇත.

ඈ. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ වලංගු මුදල

සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ වලංගු මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ.
වෙනත් යම් අයුරකින් දක්වා ඇති අවස්ථාවකදී හැරුණු කොට, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්න දහසට වටයනු ලැබ ඇත.

ඉ. ප්‍රධාන ඇස්තමේන්තු සහ වැදගත් තීන්දු භාවිත කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගත වූ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම මඟින් කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්හි වාර්තාගත වටිනාකම් කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන ස්වරූපයේ තීන්දු ගැනීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ පූර්ව නිගමනවලට එළඹීම අපේක්ෂා කෙරේ.

ඇස්තමේන්තු සහ පාදක කර ගත් පූර්ව නිගමන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුව සංශෝධනය කරනු ලබන කාල සීමාව තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සිදු කරනු ලබන සංශෝධන හඳුනා ගනු ලබන්නේ, එම සංශෝධනය එම කාල සීමාව සඳහා පමණක් බලපාන්නේ නම් හෝ එකී සංශෝධනය වර්තමාන සහ අනාගත කාල සීමා දෙකටම බලපාන්නේ නම්, එම සංශෝධන කාල සීමාව සහ අනාගත කාල සීමාවන් තුළදී ය.

ඊ. ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය

නුදුරු අනාගත කාලය තුළ ක්‍රියාත්මක ව්‍යාපාරයක් වශයෙන් සමාගම නොකඩවා පවත්වාගෙන යාමට ඊට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් කර ඇති අතර ස්වකීය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව පවතින බවට මණ්ඩලය සෑහීමට පත් වෙමින්, ඒ අනුව සමාගම ක්‍රියාත්මක තත්වයේ පවත්වාගෙන යාමේ උපකල්පනය නුදුරු අනාගත කාල සීමාව තුළ නොකඩවා යොදාගත හැකි බවට ද සහතික වෙයි.

1.2 වත්කම් සහ එම වත්කම් තක්සේරු කිරීමේ පදනම්

1.2.1 දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ

අ. හඳුනාගැනීම සහ ඇගයීම

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද සාධාරණ අගය යටතේ හෝ වෙනත් යම් දුබලතා අලාභ යටතේ දක්වා ඇත.

සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් මූලික වශයෙන් සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද පිරිවැය යටතේ හෝ යම් දුබලතා අලාභ යටතේ වාර්තා කර ඇත. වත්කමක වැදගත් අංග හඳුනා ගෙන, වෙන වෙනම ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ. දේපල, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවල වැදගත් අංග අන්තර් කාලය තුළ ආදේශ කරනු ලැබීමට අවශ්‍ය වන්නේ නම්, ආයතනය විසින් එම ආදේශ කළ කොටස බැහැර කරන අතර, නව කොටසෙහිම ප්‍රයෝජ්‍ය ජීව කාලය සහ ක්ෂය වීම් සමඟ එම කොටස හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම අළුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය පැන නඟිනු ලබන පරිදි, ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ආ. පිරිවැය

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණවල පිරිවැය, ඒවා මිලදී ගත් මිල සහ එයින් අපේක්ෂිත කාර්යය උදෙසා එම වත්කම ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම පිණිස සෘජුවම දරන ලද වෙනත් පිරිවැයෙන් සමන්විත වේ.

ඉපැයීමේ ධාරිතාව පවත්වාගෙන යාමේ හෝ ඉහළ නැංවීමේ අරමුණින්, ස්ථිර ස්වරූපයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරනු ලබන පසුකාලීන වියදම්, ප්‍රාග්ධන වියදම් සේ සලකනු ලැබ ඇත.

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ පරීක්ෂා කිරීමේ වියදම් ඇතුලත්, වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරනු ලබන දේපළක, පිරියතක සහ යන්ත්‍රෝපකරණයක එක් අංගයක් ආදේශ කිරීම සඳහා දරනු ලබන වියදම, ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. වෙනත් පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ, එම අංගයේ ඇතුලත් ඉදිරි ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ හැකියාවක් පවතී නම් සහ එහි පිරිවැය යථාර්ථවාදී ලෙස අගයනු ලැබිය හැකි නම් පමණි.

ඇ. ක්ෂය කිරීම්

වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය මත එම වත්කම්හි පිරිවැය ඉවත් කිරීම පිණිස, පහත සඳහන් වටිනාකම් යටතේ සෘජු රේඛීය පදනම (straight-line basis) මත වාර්ෂිකව, ප්‍රාග්ධන සංචිතය වෙත ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ.

ගොඩනැගිලි	අවුරුදු 20 ට වැඩි
පිරියත සහ යන්ත්‍රෝපකරණ	අවුරුදු 10 ට වැඩි
මෝටර් රථ	අවුරුදු 05 ට වැඩි
උපකරණ හා මෙවලම්	අවුරුදු 05 ට වැඩි
විද්‍යාගාර උපකරණ	අවුරුදු 10 ට වැඩි
කෘෂිකාර්මික උපකරණ	අවුරුදු 10 ට වැඩි
විදුලි වැඩ	අවුරුදු 05 ට වැඩි
කාර්යාල උපකරණ	අවුරුදු 10 ට වැඩි
ලී බඩු සහ සවි කිරීම්	අවුරුදු 10 ට වැඩි

ඈ. හඳුනා නොගැනීම

බැහැර කරන විටදී හෝ භාවිතයෙන් කිසිදු ඉදිරි ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරනු ලබන අවස්ථාවකදී, දේපළක, පිරියතක සහ යන්ත්‍රෝපකරණයක අංගයක් හඳුනා නොගනු ලැබූ සේ සැලකේ. වත්කම් හඳුනා නොගැනීම මත හිමි වන ඕනෑම ලාභයක් හෝ පාඩුවක්, එම හඳුනා නොගැනීම සිදු කරනු ලබන වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ඇතුලත් කරනු ලැබේ.

1.2.2 නිම නොවූ වැඩ

භාවිතයේ පවතින ප්‍රාග්ධනය පිරිවැයෙහි දක්වනු ලැබේ. මෙම වියදම්, ප්‍රාග්ධනීකරණය වීමට ඇති ගොඩනැගිලි ඉදි කිරීමේදී සෘජුවම හට ගන්නා ප්‍රාග්ධන ස්වරූපයක වියදම් වේ. භාවිතයේ පවතින ප්‍රාග්ධනය, භාවිතය සඳහා ලබා ගත හැකි අවස්ථාවේදී, අදාළ දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වත්කම් වර්ගීකරණයට මාරු කරනු ලැබේ. එනම්, සමාගම විසින් අපේක්ෂිත අයුරින් ඒ සඳහා ක්‍රියාත්මක වීමට හැකි ආකාරයෙන් එය පිහිටා ඇති අවස්ථාවේදී සහ අවශ්‍ය තත්ත්වයෙන් පවතින අවස්ථාවේදී ය. භාවිතයේ පවතින ප්‍රාග්ධනය, ණය ලබා ගැනීමේ පිරිවැය, යම් සමුච්චිත දුබලතා අලාභ ඇතුලත් පිරිවැය තුළ දක්වනු ලැබේ.

1.2.3 අස්පෘශ්‍ය වත්කම්

වත්කම වෙත ලැබෙන ඉදිරි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 අස්පෘශ්‍ය වත්කම්හි පරිදි වත්කමෙහි පිරිවැය යථාර්ථවාදී ලෙස ඇගයීමේ හැකියාවක් පවතී නම්, එය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. ඒ අනුව, මෙම වත්කම්, මූල්‍ය ප්‍රකාශයේ සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත දුබලතා අලාභ පිරිවැය යටතේ සඳහන් කරනු ලැබේ.

පරිගණක මෘදුකාංග වර්ෂ 5 ක කාල සීමාවක් පුරා සෘජු රේඛීය ක්‍රමය මත ක්‍රමක්ෂය කර ඇත.
වර්ෂ 5ක කාලසීමාවක් පුරා සෘජු රේඛීය ක්‍රමය මත විෂයමාලා පරිපාටි සංවර්ධනය කිරීමේ පිරිවැය ලියා අස්කර තිබේ.

1.2.4 භාණ්ඩ ලේඛන

කල් ඉකුත් වූ සහ අඩු ක්‍රියාකාරී අයිතම සඳහා නිසි ඉඩ ලබා දීමෙන් අනතුරුව, සාමාන්‍ය පිරිවැය යටතේ භාණ්ඩ ලේඛන ඇගයීම සිදු කරනු ලැබේ. ලබා ගත හැකි දළ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන මිලයි.

භාණ්ඩ ලේඛන වත්මන් ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒමේදී දරනු ලබන පිරිවැය, පහත සඳහන් සූත්‍ර භාවිත කරමින් ගිණුම්ගත කරනු ලැබේ : -

අමුද්‍රව්‍ය	-	ගත් මිලට
නිම කළ භාණ්ඩ සහ නිම නොවූ වැඩ	-	සෘජු ද්‍රව්‍ය සහ සෘජු ශ්‍රම පිරිවැය යටතේ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව මත පදනම්ව ස්ථිර නිෂ්පාදිතයේ යෝග්‍ය සමානුපාතිකයක් සඳහා වියදම් වෙන් කිරීම් සිදු කරනු ලබයි.
ගෙන යාමට නියමිත භාණ්ඩ	-	තථ්‍ය පිරිවැය යටතේ

ලබා ගත හැකි දළ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන ඇස්තමේන්තුලගත විකුණුම් මිලයි.

1.2.5 වත්කම් දුබලතාවයට පත්වීම

දුබලතාවයට පත්වීම පිළිබඳ යම් සඳහනක් වේ දැයි නිර්ණය කිරීම සඳහා සෑම වාර්තා කරනු ලබන දිනකදීම වත්කම්හි ප්‍රවාහන පිරිවැය සමාලෝචනය කරනු ලැබේ. එවැනි සඳහනක් වුවහොත්, නැවත ලබා ගත හැකි වත්කම් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. දුබලතාවයට අලාභයක් හඳුනා ගනු ලබන්නේ, යම් වත්කමක ප්‍රවාහන පිරිවැය හෝ මුදල් ජනනය කිරීමේ ඒකකය, එහි නැවත ලබා ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේ නම්ය. නැවත ලබා ගත හැකි ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා භාවිත කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදු වී ඇත්නම්, දුබලතා අලාභය නැවත හරවාලනු ලැබේ.

1.2.6 මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යටතේ පවත්නා මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු, කල් පිරීමට නියමිත ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හරහා සාධාරණ අගයක් යටතේ වන මූල්‍ය වත්කම් ලෙස හෝ යෝග්‍ය පරිදි, ඵලදායී සීමාවක් තුළ සීමා කිරීමේ උපකරණ ලෙස සලකනු ලබන ව්‍යුත්පන්න ලෙස හෝ වර්ගීකරණය කරනු ලැබේ. සමාගම විසින් පළමු අවස්ථාවේදීම, සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය පිළිබඳව නිර්ණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකම් අතිරික්තය යටතේ හඳුනාගනු ලබන්නේ, ගණුදෙණු පිරිවැය සඳහා සෘජුවම බලපෑම් කරනු ලබන, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයක් යටතේ වත්කම් නොවනු ලබන අවස්ථාවකදී ය.
සමාගම විසින්, ඔවුන් සිය සමාගම ස්ථාපිත කළ දිනයේ සිට ණය, ලැබිය යුතු සහ තැන්පතු හඳුනාගනු ලැබේ. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ දක්වා ඇති වත්කම් ඇතුලත්ව) මූලිකව හඳුනාගනු ලබන්නේ, වෙළඳ ගිවිසුමෙහි ගිවිසුම්ගත විධිවිධාන සඳහා සමාගම විසින් පාර්ශ්වකරුවකු වනු ලබන වෙළඳ දිනයේදී ය.
වත්කමකින් ලැබෙන මුදල් ප්‍රවාහ සඳහා ගිවිසුම්ගත අයිතින් කල් ඉකුත් වූ විට, සමාගම විසින් එම මූල්‍ය වත්කම බැහැර කරනු ලබන අතර, එමගින් මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබා ගැනීම උදෙසා, සාරානුකූලව මූල්‍ය වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දෙනු ලබන ගණුදෙණුවක් හරහා එම අයිතිය මාරු කරනු ලැබේ. සමාගම විසින් ඇති කරනු ලබන හෝ රඳවා තබා ගනු ලබන, පවරන ලද මූල්‍ය වත්කම්හි ඕනෑම පොලියක්, වෙන් වෙන් වශයෙන් වත්කමක් හෝ වගකීමක් සේ හඳුනාගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ වගකීම් කපා හැරීමක් වන අතර, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ එම දළ අගය ඉදිරිපත් කරනු ලබන්නේ, එම අගයන් කපා හැරීමට සමාගම සතුව නෛතික අයිතියක් පවතින විට සහ දළ පදනමක් මත නිරවුල් කිරීමට හෝ වත්කම අත්පත් කොට ගෙන, ඒ හා සමගාමීව වගකීම නිරවුල් කිරීමට අපේක්ෂා කරන්නේ නම් පමණකි.

සමාගමේ මූල්‍ය වත්කම් තුළ මුදල්, කෙටිකාලීන ආයෝජන, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ ඇතුලත් වේ.

අ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම්
ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම් තුළ වෙළඳාම සඳහා දරන ලද මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත වර්ගීකරණයට ලක් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා දරන ලද්දේ යයි වර්ගීකරණය කරනු ලබන්නේ, ආසන්නතම කාල සීමාව තුළදී විකුණීමේ හෝ නැවත මිලදී ගැනීමේ අරමුණින්, එම වත්කම් අත්පත් කරගනු ලබන්නේ නම්ය.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූල්‍ය වත්කම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායම හෝ මූල්‍ය වියදම තුළ හඳුනා ගනු ලබන සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් සමඟ සාධාරණ වටිනාකම යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ දක්වාලනු ලැබේ.

සමාගම විසින් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත කිසිදු මූල්‍ය වත්කමක් වර්ගීකරණය කර නොමැත.

ආ. ණය සහ ලැබිය යුතු දෑ
ණය සහ ලැබිය යුතු දෑ යනු, ක්‍රියාකාරී වෙළඳපොළක් තුළ මතු කොට දක්වා නොමැති, ස්ථිර හෝ ලැබේ යයි සැලකිය හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ඇගයීමෙන් අනතුරුව, හායන අඩු කර ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ පසුව අගයනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ, අත්පත් කරගැනීම මත ලද වට්ටම් හෝ වාරික සහ ඵලදායී පොලී අනුපාතයෙහි වැදගත් කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගැනීමෙනි. දුබලත්වය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.
ලැබිය යුතු වෙළඳ ආදායම්, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, වෙනත් ලැබිය යුතු සහ මුදල් සහ මුදල් සමාන දෑ ආදියෙන් ණය සහ ලැබිය යුතු ආදායම් සමන්විත වේ.

ඇ. කල් පිරීමට නියමිත ආයෝජන
ස්ථිර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල් පිරෙන තැන්පතු හා බැඳි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, සමාගම විසින් ධනාත්මක අදහසකින් පසු වන සහ කල් පිරෙන තෙක් ඒවා රඳවා තබා ගැනීමේ හැකියාව සමාගම සතු වූ විට, කල් පිරීමට නියමිත ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික ඇගයීමෙන් අනතුරුව, දුබලතා ඌණ ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි කල් පිරීමට නියමිත ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය යටතේ පසුව අගයනු ලැබේ. ඵලදායී පොලී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුළ හඳුනාගනු ලැබේ. රජයේ සුරැකුම්පත් සහ ස්ථිර තැන්පතුවල කරනු ලබන ආයෝජන, කල් පිරීමට නියමිත ආයෝජන යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇත.

ඇ. විකිණීමට හැකි මූල්‍ය ආයෝජන

විකිණීමට හැකි ලෙස හෝ ඉහත සඳහන් මූල්‍ය වත්කම් වර්ගීකරණ කිසිවක් තුළ වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, විකිනීමට හැකි මූල්‍ය වත්කම් වේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, එම වත්කම් සාධාරණ වටිනාකම අනුව අගයනු ලබන අතර, දුබලතා අලාභ හැර වෙනස්කම් වෙනත් විස්තිර්ණ ආදායම් තුළ හඳුනා ගනු ලබන අතර, අරමුදල් සහ සංචිතවල තැන්පත් කර ඇති සාධාරණ වටිනාකමින් ඉදිරිපත් කරනු ලැබේ. විකිණීමට හැකි ණය සුරැකුම් මත පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය භාවිත කරමින් ගණනය කරනු ලබන අතර, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. යම් ආයෝජනයක් හඳුනා ගනු නොලැබූ විට, අරමුදල් හෝ සංචිත තුළ සමුච්චිත ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ ගිණුමෙහි නැවත වර්ගීකරණය කරනු ලැබේ.

මූලික හඳුනා ගැනීම මත, සමාගම විසින් කිසිදු මූල්‍ය වත්කමක් විකිණීමට හැකි ආයෝජනයක් ලෙස හඳුනා ගනුලැබ නොමැත.

1.2.7.1 මූල්‍ය වත්කම් දුබලත්වයට පත්වීම

සමාගම විසින් සෑම වාර්තා කරනු ලබන දිනකදීම, මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලත්වයට පත්වී ඇති බවට හරයාත්මක සාක්ෂි පවතිදැයි අගයනු ලබන අතර, එවැනි දුබලත්වයක් සිදු වී ඇත්නම්, එම දුබල වී ඇති ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ, වත්කම් දැරීමේ වටිනාකම සහ ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගනිමිනි.

1.2.8 මුදල් හා මුදල් සමානයන්

අතැති මුදල්, බැංකු තැන්පතු සහ නැවත මිලදී ගැනීමේ ගිවිසුම් යනාදියෙන් මුදල් සහ මුදල් සාම්‍යයන් සමන්විත වේ.

සෘජු නොවන ක්‍රමවේදය භාවිත කරමින් සකස් කරනු ලැබ ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් සහ මුදල් සාම්‍යයන්ගේ අංගයක් ලෙස බැංකු අයිරාව ඇතුලත් කරනු ලැබේ.

1.3 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන වගකීම් වනුයේ, ඉල්ලීම මත හෝ වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයක් තුළ ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ය. වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයකට පසු ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ජංගම නොවන වත්කම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, දත් සියලුම වගකීම් සලකා බලනු ලැබේ. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සාධනිය වගකීමක් සමාගම සතුවන අවස්ථාවේදී, ප්‍රතිපාදන සහ වගකීම් හඳුනා ගනු ලබන අතර, මෙම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇත.

1.3.1 සේවක ප්‍රතිලාභ

අ. විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ, සියලුම සුදුසුකම් ලත් සේවකයින් උදෙසා සමාගම විසින් ප්‍රතිලාභ සැලැස්මක් අදාළ කරගනු ලැබ ඇත. මෙම ප්‍රතිලාභ සැලැස්ම සඳහා බාහිර වශයෙන් අරමුදල් සපයනු නොලැබේ.

මෙම ප්‍රතිපාදන ගණනය කිරීමේදී භාවිත කරනු ලබන මූලික පූර්ව නිගමන තුළ පහත දැක්වෙන කරුණු ඇතුලත් වේ:

වට්ටම් අනුපාතය	12%
ඉදිරි වැටුප් වැඩිවීම් අනුපාතය	10%
කාර්ය මණ්ඩල පිරිවැටුම	02%
විශ්‍රාම ගැනීමේ වයස	අවුරුදු 55

සමාගම ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

ආ. නිශ්චිත දායකත්ව සැලැස්ම

නිශ්චිත දායකත්ව සැලැස්ම පශ්චාත් සේවා නියුක්ති සැලැස්මක් වන අතර, ඒ යටතේ ආයතනයක් විසින් වෙනත් යම් ආයතනයක් වෙත ස්ථිර දායකත්වයක් ගෙවනු ලබන අතර, අමතර වටිනාකමක් ගෙවීම සඳහා ඊට කිසිදු නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් හිමි නොවනු ඇත. නිශ්චිත දායකත්ව සඳහා වන බැඳීම් වෙනුවෙන් වන දායකත්ව, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හිඟ ලෙස පෙන්නුම් කෙරෙන පරිදි සහ ඒවා නියමිත වන්නා වූ අවස්ථාවන්හිදී එම ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

ඇ. සේවක අර්ථසාධක අරමුදල

එක් එක් සේවකයකුගේ වැටුප මත සමාගම සහ සේවකයා විසින් පිළිවෙළින්, 12% හා 8% බැගින් වන පරිදි, අනුමත කරන ලද අර්ථසාධක අරමුදල වෙත සිය දායකත්වය සපයනු ලැබේ.

ඇ. සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් විසින් එක් එක් සේවකයකුගේ වැටුප මත 3% ක් වූ ප්‍රමාණයක් අනුව සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත සිය දායකත්වය සපයනු ලැබේ.

1.3.2 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ පිරිවැයෙහි සඳහන් කරනු ලැබේ.

1.3.3 බදුකරණය

ලාභාංශ හෝ පොලිවලින් ලද අතිරික්තය සහ ආදායම් හැර, සමාගමේ අතිරික්තය සහ ආදායම්, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි 7(b) (ixiv) වගන්තිය යටතේ ආදායම් බදුවලින් නිදහස් කෙරේ.

1.3.4 කල් තබන ලද බදුකරණය

සමාගමේ අතිරික්තය සහ ආදායම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි 7(b) (ixiv) වගන්තිය යටතේ ආදායම් බදුවලින් නිදහස් කර ඇති හෙයින්, විලම්බිත බදු සඳහා විධිවිධාන සකස් කර නොමැත.

1.3.5 ප්‍රාග්ධන වගකීම් හා අවිනිශ්චිත වගකීම්

අවිනිශ්චිත වගකීම් යනු, ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදු කළ නොහැකි හෝ නිසියාකාරව ගණනය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන වගකීම්වලින් පමණක් පැවැත්ම සහතික කරනු ලැබිය හැකි වගකීම් ය.
මූල්‍ය ප්‍රකාශනවලට සිදු කරන අදාළ සටහන්හි සමාගමේ ප්‍රාග්ධන වගකීම් සහ අවිනිශ්චිත වගකීම් අනාවරණය කරනු ලැබේ.

1.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

ප්‍රාග්ධන සංචිතය (ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළව)

වර්ෂ 2000 සිට සෞඛ්‍ය අමාත්‍යාංශය, කෙයා (CARE) ආයතනය සහ ශ්‍රී ලංකා දුම්කොළ සමාගම විසින් ස්ථිර වත්කම් මත වැය කරන ලද අරමුදල්, ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සලකනු ලැබ ඇති අතර, ඒ අනුව, වර්ෂය සඳහා සමස්ත ක්ෂය කිරීම් සඳහා හිලව් කිරීම සිදු කරමින්, මෙම විෂයන්ට අදාළ ක්ෂය කිරීම් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්වලට ඇතුලත් කරනු ලැබ ඇත.

1.4.1 ප්‍රදාන

යම් ප්‍රදානයක් ලැබෙන බවට සහ ඊට යා කොට ඇති කොන්දේසි හා අනුගත වනු ඇති බවට සාධාරණ සහතිකවීමක් පවතින අවස්ථාවකදී රජයේ ප්‍රදාන හඳුනා ගනු ලැබේ.

සමාගම තුළ ඇති කෙරෙනු ලබන වියදම් වෙනුවෙන් ඒ වෙත පිරිනමනු ලබන ප්‍රදාන, එම වියදම් හඳුනා ගනු ලබන වර්ෂයේම විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ආදායම් ලෙස හඳුනාගනු ලැබේ. යම් වත්කමක පිරිවැය සඳහා සමාගම වෙත ලබා දෙනු ලබන ප්‍රදාන, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

1.4.3 වියදම්

අ. ජනනය වූ පිරිවැය සහ සුවිශේෂී ආදායම් වර්ග ඉපැයීම් අතර සෘජු සබඳතාව මත පදනම්ව, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනා ගනු ලැබේ. සමාගමෙහි මෙහෙයුම් කටයුතුවලදී සහ කාර්යක්ෂම අවස්ථාවන්හිදී ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේදී ඇති වන සියලුම වියදම්, එම වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේදී ආදායම්හි ප්‍රතිපාර්ශ්වීය ලෙස අය කරගනු ලැබ ඇත.

1.4.4 මූල්‍ය වියදම්/ආදායම්

ආයෝජනය කරන ලද අරමුදල් සඳහා උපචිත පදනම මත ලද පොලියෙන් මූල්‍ය ආදායම සමන්විත වේ.

1.5 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති 7 හා අනුගතව සකස් කරනු ලැබ ඇත.

ගෙවන ලද පොලී, මෙහෙයුම් මූල්‍ය ප්‍රවාහ යටතේ වර්ගීකරණය කරනු ලබන අතර, ලද පොලිය, ආයෝජන මූල්‍ය ප්‍රවාහ යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

1.6 වාර්තා කිරීමේ කාලසීමාව අවසානයේ සිදුවීම්

වාර්තා කිරීමේ කාල සීමාව අවසානයේ හට ගනු ලබන සිදුවීම්වල වාස්තවික බව සලකා බලනු ලැබ ඇති අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී ගිණුම් තුළ යෝග්‍ය ගැළපුම් සිදු කරනු ලැබ ඇත.

1.7 නිකුත් කරන ලද, එහෙත් තවමත් ක්‍රියාත්මකභාවයේ නොමැති ප්‍රමිතීන්

සමාගමෙහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශ නිකුත් කළ දින දක්වා නිකුත් කරන ලද, එහෙත් තවමත් ක්‍රියාත්මකභාවයේ නොමැති ප්‍රමිතීන් පහත දැක්වේ. නිකුත් කරන ලද ප්‍රමිතීන් සහ අර්ථනිරූපණ ලේඛනය යනු, ඉදිරි දිනකදී අදාළ කරගනු ලබන අවස්ථාවකදී, අනාවරණය කිරීම්, මූල්‍ය තත්ත්වය හෝ කාර්යසාධනය මත බලපෑමක් ඇති කෙරෙනු ඇති බවට සමාගම විසින් සාධාරණව අපේක්ෂා කරනු ලබන ප්‍රමිතීන් සහ අර්ථනිරූපණ වේ. මෙම ප්‍රමිතීන් බලාත්මක වනු ලබන අවස්ථාවේදී, එම ප්‍රමිතීන් අදාළ කරගනු ලැබීමට සමාගම විසින් අපේක්ෂා කරනු ලබයි.

අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 මූල්‍ය උපකරණ :

වර්ගීකරණය සහ ගණනය කිරීමේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ආදේශ වනු ලබන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39හි අර්ථනිරූපිත මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ ගණනය කිරීම සඳහා අදාළ කරගනු ලැබේ. මෙම ප්‍රමිතියෙහි අනිවාර්ය බලාත්මක දිනය කල් තබා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9හි පළමු අදියර අදාළ කරගැනීම මගින් සමාගමෙහි මූල්‍ය වත්කම්වල වර්ගීකරණය සහ ගණනය කිරීම මත බලපෑමක් ඇති කරනු ලබන නමුත්, වාස්තවිකව මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ ගණනය කිරීම මත කිසිදු බලපෑමක් ඇති නොකරනු ලැබේ. විස්තරාත්මක ඉදිරිපත් කිරීමක් ඉදිරිපත් කිරීම පිණිස, නිකුත් කරනු ලැබූ විට, සමාගම විසින් අනෙකුත් අදියරයන් හා එක්ව ගෙන එහි බලපෑම ගණනය කරනු ලැබේ.

1.8 විකිණීම සඳහා තබාගන්නා ලද ජංගම නොවන වත්කම්

නිරන්තර භාවිතය හරහා නොව මූලිකව, බැහැර කිරීම මගින් නැවත ලබාගැනීමට අපේක්ෂිත ජංගම නොවන වත්කම්, විකුණුම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. විකුණුම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කිරීමට වහාම ප්‍රථම, සමාගමෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගතව මෙම වත්කම් නැවත ගණනය කරනු ලැබේ. ඉන් පසුව, එම වත්කම්හි වටිනාකමට අඩු වටිනාකම සහ විකුණුම් පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම යටතේ එම වත්කම් ගණනය කරනු ලැබේ. විකුණුම් සඳහා තබාගන්නා ලද, මූලික වර්ගීකරණය කිරීම මත හායන පාඩු සහ නැවත ගණනය කිරීම මත ලද පසුකාලීන ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. කිනම් හෝ සමුච්චිත හායන පාඩුවක් ඉක්මවා ලැබීම් හඳුනාගනු නොලැබේ.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2015 රු. ශත.	2014 රු.
02. වර්ෂය තුළ ප්‍රතිපූර්ණ වියදම්		
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම	1,776,421,902.86	1,776,560,232
	1,776,421,902.86	1,776,560,232

	2015	2014
03. නිෂ්පාදන පිරිවැය		
අමුද්‍රව්‍ය පරිභෝජනය	1,571,947,199.31	1,429,613,561
සෘජු ශ්‍රමය	132,557,413.91	109,605,729
කම්හල් පොදුකාර්ය වියදම්	90,556,367.17	89,129,410
ප්‍රථමික පිරිවැය	1,795,060,980.39	1,628,348,699
එකතු කළා :වසර ආරම්භයේ නිමි භාණ්ඩ	39,550,477.97	16,192,484
වසර ආරම්භයේ විවිධ නිෂ්පාදන	-	86,008
අඩු කළා : වසර අවසානයේ නිමි භාණ්ඩ	(38,202,137.04)	(39,550,478)
වසර අවසානයේ විවිධ නිෂ්පාදන	-	(86,008)
නැවත සකස් කිරීමේ පිරිවැය	(3,213,954.00)	(443,713)
	1,793,195,367.32	1,604,546,992

	2015	2014
04. වෙනත් ආදායම්		
අපතය විකුණුම්	15,931,714.45	11,651,849
වෙනත් ආදායම්	4,884,242.05	145,610
භාණ්ඩාගාර බිල්පත් මත පොලී ආදායම්	3,599,382.96	5,443,747
ගෝනි විකුණුම්	-	2,068,770
විවිධ ආදායම් - විවිධ ද්‍රව්‍ය	-	308,837
නිවාස ණය පොලී	1,364,374.97	1,469,059
	25,779,714.43	21,087,872

05. වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම

වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම ගණනය කිරීමේදී පහත සඳහන් විෂයයන් සඳහා අයකිරීම් සිදු කරනු ලැබ ඇත.

	2015 රු. ශත.	2014 රු.
මූලික වැටුප් සහ දිරි දීමනා	8,008,393.00	6,095,071
විගණන ගාස්තු	109,807.50	99,825
වෙනත් පරිපාලන වියදම්	27,985,700.48	29,891,792
බෙදාහැරීමේ වියදම්	11,119,781.08	7,232,959
මූල්‍ය සහ වෙනත් වියදම්	3,272,031.49	1,311,290
	50,495,713.55	44,630,937

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

06. දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය / වටිනාකම	2015.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	මාරු කිරීම්	2015.12.31 දිනට ශේෂය
ඉඩම්	220,000,000.00	-	-	220,000,000.00
ගොඩනැගිලි	73,311,959.28	3,452,122.78	-	76,764,082.06
පිරියත හා උපකරණ	137,780,630.79	20,641,826.41	(600,000.00)	157,822,457.20
මෝටර් රථ	13,258,750.00	8,950,000.00	-	22,208,750.00
උපකරණ හා අම්පන්න	10,197,189.38	1,732,723.59	-	11,929,912.97
විද්‍යාගාර උපකරණ	5,192,330.00	509,857.50	-	5,702,187.50
කෘෂිකාර්මික උපකරණ	138,650.00	-	-	138,650.00
විදුලි වැඩ	1,127,746.45	1,320,904.36	-	2,448,650.81
කාර්යාල උපකරණ	10,441,631.62	1,862,495.00	-	12,304,126.62
ගෘහ භාණ්ඩ හා උපාංග	3,552,848.70	782,002.59	-	4,334,851.29
	475,001,736.22	**39,251,932.23**	**(600,000.00)**	**513,653,668.45**

සමුච්චිත ක්ෂය කිරීම්	2015.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	මාරු කිරීම්	2015.12.31 දිනට ශේෂය
ගොඩනැගිලි	7,820,672.40	3,793,402.57	-	11,614,074.97
පිරියත හා උපකරණ	29,687,660.25	14,811,503.90	(130,000.00)	44,369,164.15
මෝටර් රථ	4,738,792.17	3,099,250.00	-	7,838,042.17
උපකරණ හා අම්පන්න	4,675,887.81	2,300,114.45	-	6,976,002.26
විද්‍යාගාර උපකරණ	1,054,930.50	570,040.69	-	1,624,971.19
කෘෂිකාර්මික උපකරණ	30,040.83	13,865.00	-	43,905.83
විදුලි වැඩ	740,476.96	309,448.33	-	1,049,925.29
කාර්යාල උපකරණ	1,985,755.84	1,062,186.83	-	3,047,942.67
ගෘහ භාණ්ඩ හා උපාංග	786,174.92	385,430.71	-	1,171,605.63
	51,520,391.68	**26,345,242.48**	**(130,000.00)**	**77,735,634.16**

ලියා අඩු කළ අගයන්	2015.12.31 රු. ශත.	2014.12.31 රු.
ඉඩම්	**220,000,000.00**	220,000,000
ගොඩනැගිලි	**65,150,007.09**	65,491,287
පිරියත හා උපකරණ	**113,453,293.05**	108,092,971
මෝටර් රථ	**14,370,707.83**	8,519,958
උපකරණ හා අම්පන්න	**4,953,910.71**	5,521,302
විද්‍යාගාර උපකරණ	**4,077,216.31**	4,137,400
කෘෂිකාර්මික උපකරණ	**94,744.17**	108,609
විදුලි වැඩ	**1,398,725.52**	387,269
කාර්යාල උපකරණ	**9,256,183.95**	8,455,876
ගෘහ භාණ්ඩ හා උපාංග	**3,163,245.66**	2,766,674
	435,918,034.29	423,481,345

සටහන :

ඉඩම සඳහා ඔප්පුවක් සමාගම් මට්ටමෙන් නොමැත.

06. අ අස්පෘශ්‍ය වත්කම්

	2015.12.31 රු. ශත.	2014.12.31 රු.
පිරිවැය	**661,187.57**	-
(-) සමුච්චිත ක්ෂය කිරීම්	-	-
ලියා අඩු කළ අගය	**661,187.57**	-

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

07. වට්ටෝරු භාණ්ඩ

	2015.12.31	2014.12.31
	රු. ශත.	රු.
අමු ද්‍රව්‍ය		
සෝයා	91,069,823.00	104,928,120
කිරි පිටි	55,451,249.50	61,476,875
බඩ ඉරිඟු	8,632,731.05	29,615,650
විටමින්	3,684,367.50	13,359,958
මිනරල්	2,545,452.00	3,573,050
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්	385,036.80	2,197,440
බහු ස්ථර පටල - ළමුන් හා මව්වරුන්	3,237,160.62	1,348,984
පොලිතින් බෑග් - රතු	250,804.76	1,184,963
පොලිතින් බෑග් - කහ	3,830,443.24	250,805
ට්වයින් නූල්	-	68,743
ඉංජිනේරු ගබඩා	10,371,511.77	9,231,383
ඩීසල්	1,586,975.00	3,865,251
පාවිච්චි කරන ලද පොලිතින් බෑග්	-	78,292
පාවිච්චි කරන ලද කිරි පිටි බෑග්	-	6,171
පොලිප්‍රොප්ලින් වියූ මළු	-	2,911
හිස් බහාලු	-	167
අපතය	-	1,378
නොනිමි වැඩ	9,025,425.56	14,567,809
නිමි භාණ්ඩ	38,202,137.04	39,550,478
එකතුව	228,273,117.84	285,308,428

08. වෙළඳ හා වෙනත් ලැබීම්

		2015.12.31	2014.12.31
		රු. ශත.	රු.
නිවාස ණය - වත්කම් ණය ගිණුම	II	17,877,066.41	24,472,839
ණයකරුවන්		1,627,719.38	10,963,842
නිවාස ණය - ආපදා ණය ගිණුම	II	10,972,101.87	5,959,544
ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල් - ලං.වි.ම.		987,500.00	987,500
විවිධ තැන්පතු සහ පූර්ව ගෙවීම්		102,748,743.02	831,314
විනෝද චාරිකා අත්තිකාරම්		233,000.00	198,000
උත්සව අත්තිකාරම්		-	159,000
කල් ඉකුත් නොවූ වියදම්		-	154,902
තැන්පතු		101,000.00	150,676
5% නිවාස ණය		-	-
		134,547,130.68	43,877,617

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2015.12.31	2014.12.31
		රු. ශත.	රු.
09.	**ආයෝජන**		
	භාණ්ඩාගාර බිල්පත් - මුහුණත් වටිනාකම	90,000,000.00	60,000,000
	ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම	251,730.77	200,275
		90,251,730.77	60,200,275
10.	**මුදල් හා මුදල් සමාන දෑ**		
	ලංකා බැංකුව, ජා-ඇල 71324617	53,922,992.19	7,461,286
		53,922,992.19	7,461,286

11. ප්‍රකාශිත ප්‍රාග්ධනය

2010.06.23 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තිරණයක ප්‍රතිඵලයක් ලෙස, ත්‍රිපෝෂ සමාගමේ කළමනාකාරිත්වය, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සම්පූර්ණ රජය සතු පොදු සීමිත සමාගමක් වෙත පවරනු ලැබ ඇත. ඒ අනුව, රු. 304,600,000/= ක (රුපියල් තුන් මිලියන හයසිය දහසක්) ප්‍රකාශිත ප්‍රාග්ධනය සහිතව 2010 සැප්තැම්බර් මස 17 වන දින ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

		2015.12.31	2014.12.31
12.	**ප්‍රාග්ධන සංචිත**	රු. ශත.	රු.
	වර්ෂය මුල ශේෂය	136,873,127.45	152,382,927
	සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	39,251,932.23	7,913,121
	ප්‍රාග්ධන වත්කම් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද අත්තිකාරම්	158,265,266.31	-
	කිරාන් අතපත්තු මහතා (සුභසාධක අරමුදල)	-	462,000
	ස්ථාවර වත්කම් ව්‍යපහරණ අලාභය	(470,000.00)	
	අඩු කළා : වර්ෂය සඳහා ක්ෂය කිරීම් ගාස්තු	(26,345,242.48)	(23,884,920)
	වර්ෂ අවසානයේ ශේෂය	307,575,083.51	136,873,127
13.	**ප්‍රත්‍යාගණන සංචිත**		
	වර්ෂය මුල ශේෂය	307,170,027.56	307,170,028
	වර්ෂය තුළ ප්‍රත්‍යාගණනය	-	-
	වර්ෂය අවසානයේ ශේෂය	307,170,027.56	307,170,028
14.	**විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්**		
	වර්ෂය මුල ශේෂය	28,130,680.00	30,086,348
	අඩු කළා :වර්ෂය තුළ ගෙවීම්	(977,538.25)	(1,543,740)
	වර්ෂය සඳහා ප්‍රතිපාදන	2,440,543.25	(411,928)
	වර්ෂය අවසානයේ ශේෂය	29,593,685.00	28,130,680

වට්ටම් ගත අනුපාතය	12%	12%
ඉදිරි වැටුප් වර්ධක අනුපාතය	10%	10%
කාර්ය මණ්ඩල පිරිවැටුම්	2%	2%
විශ්‍රාම ගැනීමේ වයස	අවු : 55	අවු : 55

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2015.12.31 රු. ශත.	2014.12.31 රු.
15.	**වෛද්‍යාධාර අරමුදල**		
	වර්ෂය මුල ශේෂය	141,163.96	62,795
	වර්ෂය තුළ දායකවීම්	173,968.00	190,158
	වර්ෂය තුළ ගෙවීම්	(73,642.00)	(111,789)
	වර්ෂය අවසානයේ ශේෂය	241,489.96	141,164
16.	**වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු**		
	ණය හිමියන්	37,381,448.21	44,465,679
	වැටුප් පාලන	-	494,288
	ගෙවිය යුතු විගණක ගාස්තු	209,632.50	190,575
	ආපසු ගෙවනු ලබන තැන්පතු	179,337.50	153,238
	වියදම් සඳහා ප්‍රතිපාදන	-	34,088
		37,770,418.21	45,337,868

17. ප්‍රාග්ධන ප්‍රදාන හා සම්බන්ධ ක්ෂය කිරීම්

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කර ඇති ස්ථිර වත්කම්වලට අදාළ ක්ෂය කිරීම්, එම වර්ෂයේ මුළු ක්ෂය කිරීමේ ගාස්තු අඩු කරමින් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට අයගත කරගනු ලැබ ඇත.

18.	**පූර්ව වර්ෂ ගැළපුම්**		
	ගෙවිය යුතු ගිණුම්වලට අදාළ ගැළපුම්	36,869.82	7,457.01
	2014 දී යන්ත්‍රෝපකරණ ව්‍යාපහරණය මත අලාභය	(470,000.00)	-
		(433,130.18)	7,457.01

19. බැඳියා සහ අවිනිශ්චිතතා

වාර්තා කරනු ලබන දිනයේදී කිසිදු සැලකිය යුතු බැඳියාවක් හෝ අවිනිශ්චිතතාවක් නොපැවතුණි.

20. සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්

ප්‍රධාන පෙළේ කාර්යමණ්ඩල සාමාජිකයින් හා පවත්නා ගනුදෙනු

සමාගමෙහි ප්‍රධාන පෙළේ කාර්යමණ්ඩල සාමාජිකයින් වනුයේ, එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ ය.

21. වාර්තා කරනු ලබන දිනට පසු ඇති වන සිදුවීම්

වාර්තා කරනු ලබන දිනට පසු මූල්‍ය ප්‍රකාශයන්හි ගැළපුම් සිදු කිරීමට හෝ අනාවරණය කිරීමට අවශ්‍ය වන පරිදි කිසිදු වැදගත් සිදුවීමක් ඇති වී නොමැත.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

22. මිශ්‍රණයේ සංයුතිය

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිර්දේශ කරනු ලැබ ඇති පරිදි, වර්ෂය තුළ භාවිත කරන ලද මිශ්‍රණයේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

	නිර්දේශිත	තථ්‍ය	විචලනතාව
බඩ ඉරිඟු	66.00%	73.39%	-7.39%
සෝයා	30.00%	22.94%	7.06%
කිරි	3.00%	2.79%	0.21%
විටමින්	0.10%	0.09%	0.01%
ඛනිජ ලවණ	0.90%	0.79%	0.11%
	100.00%	**100.00%**	**0.00%**

23. ප්‍රමිතිගත අපතේ යාම

	තෙතමනය	සැකසුම	එකතුව
බඩ ඉරිඟු	14.00%	6.50%	20.50%
සෝයා	12.00%	9.50%	21.50%
කිරි	4.00%	0.00%	4.00%
විටමින්	3.00%	0.00%	3.00%
ඛනිජ ලවණ	3.00%	0.00%	3.00%

24. අමුද්‍රව්‍ය පරිභෝජනය (වටිනාකමින්)

	ප්‍රමාණය	වටිනාකම	කිලෝග්‍රෑමයක සමාන්‍ය වටිනාකම (තථ්‍ය)	කිලෝග්‍රෑමයක වටිනාකම (අයවැයගත)	අයවැයට එරෙහි විචලනතාව
		රු.	රු.	රු.	රු.
බඩ ඉරිඟු (කි.ග්‍රෑ.)	11,598,378	581,141,112	50.11	51.06	0.95
සෝයා (කි.ග්‍රෑ.)	3,625,320	488,205,786	134.67	136.53	1.86
කිරි (කි.ග්‍රෑ.)	441,375	339,815,625	769.90	509.00	(260.90)
විටමින් (කි.ග්‍රෑ.)	14,575	32,032,058	2,197.74	3,996.00	1,798.26
ඛනිජ ලවණ (කි.ග්‍රෑ.)	124,325	32,059,147	257.87	362.97	105.10
ක්‍රාෆ්ට් කඩදාසි (බෑග්)	648,300	19,611,725	30.25	25.62	(4.63)
පොලිතින් (බෑග්)	9,237,000	33,240,336	3.60	4.00	0.40
පොලිතින් රෝල් (කි.ග්‍රෑ.)	83,752.60	40,199,166	479.98	479.00	(0.98)
නූල් කෝන් (ගණන)	524	99,861	190.57	253.08	62.51

25. නිෂ්පාදනය

	ඉලක්කගත	තථ්‍ය	විචලනතාව
නිෂ්පාදිත මාස්ටර් බෑග් ප්‍රමාණය	710,347	648,545	(61,802)
පරිපාලන වියදම් ද ඇතුළත්ව නිෂ්පාදන වියදම් - බෙදාහැරීමේ හා වෙනත් වියදම් (රු)	2,500,000,000	1,842,342,740	(657,657,260)
මාස්ටර් බෑගයක් සඳහා පිරිවැය (රු)	3,519.41	2,840.73	678.67

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශ සඳහා විස්තරාත්මක සටහන්
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

			2015.12.31 රු. ශත.	2014.12.31 රු.
01.	වර්ෂය තුල ප්‍රතිපූර්ණ වියදම්			
	සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම		1,776,421,902.86	1,776,560,232
			1,776,421,902.86	1,776,560,232
02.	නිෂ්පාදන පිරිවැය			
	අමුද්‍රව්‍ය පාරිභෝජනය	02.1	1,571,947,199.31	1,429,613,561
	සෘජු ශ්‍රමය	02.2	132,557,413.91	109,605,729
	කම්හල් පොදු කාර්ය වියදම්	02.3	90,556,367.17	89,129,410
	මූලික පිරිවැය		1,795,060,980.39	1,628,348,699
	එකතු කළා : වසර ආරම්භයේ නිමි භාණ්ඩ		39,550,477.97	16,192,484
	වසර ආරම්භයේ විවිධ නිෂ්පාදන		-	86,008
	අඩු කළා : වසර අවසානයේ නිමි භාණ්ඩ		(38,202,137.04)	(39,550,478)
	වසර අවසානයේ විවිධ නිෂ්පාදන		-	(86,008)
	නැවත සකස්කිරීමේ අලාභය		(3,213,954.00)	(443,713)
			1,793,195,367.32	1,604,546,992
02.1	අමුද්‍රව්‍ය පාරිභෝජනය			
	ආරම්භක තොගය		218,004,587.81	98,759,306
	එකතු කළා : මිලදී ගැනිම්			
	තිරිඟු		571,589,036.91	507,513,342
	සෝයා		469,873,548.10	509,341,294
	කිරි පිටි		333,790,000.00	382,585,367
	පෙර මිශ්‍රිත ඛණිජ ලවණ		31,141,493.00	22,364,343
	විටමින්		22,362,670.50	44,722,650
	ක්‍රාෆ්ට් පේපර් බෑග්		13,322,691.75	18,848,676
	ඇසුරුම් අමුද්‍රව්‍ය		75,029,056.54	73,428,607
	ට්වයින් නූල්		378,800.00	191,109
	අවසන් තොගය		(169,087,068.97)	(218,004,588)
			1,566,404,815.64	1,439,750,106
	එකතු කළා : වසර ආරම්භයේ කෙරෙමින් පැවති වැඩ		14,567,809.23	4,431,264
	අඩු කළා : වසර අවසානයේ කෙරෙමින් පැවති වැඩ		(9,025,425.56)	(14,567,809)
			1,571,947,199.31	1,429,613,561

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශ සඳහා විස්තරාත්මක සටහන්
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

		2015.12.31 රු. ශත.	2014.12.31 රු.
02.2	සෘජු ශ්‍රම සහ කළමනාකරණ පිරිවැය		
	කර්මාන්ත ශාලා වැටුප් සහ වේතන		
	මූලික වැටුප	59,093,740.47	39,763,616
	අතිකාල දීමනා	19,366,100.29	16,919,512
	ජීවන වියදම	15,342,600.00	16,762,296
	සේවක අර්ථසාධක අරමුදල	6,743,829.74	6,531,660
	දිරි දීමනා	6,002,713.08	5,527,311
	ඉලක්ක	3,735,810.44	3,433,291
	නිවාඩු දීමනා	3,848,103.13	3,318,386
	සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	1,685,955.81	1,642,073
	විශේෂ දීමනාව	892,091.25	619,858
	සේවා මුර හා ආහාර දීමනාව	1,583,666.00	1,479,700
	වෛද්‍ය සේවා ප්‍රතිගෙවුම්	381,791.82	222,213
	කළමනාකරණ ගාස්තු	-	96,444
	අවිනිශ්චිතතා	-	9,506
	පාරිතෝෂික	2,413,806.16	-
	ගිවිසුම්ගත වේතන		
	වැටුප් හා වේතන	2,060,041.22	2,453,380
	අතිකාල දීමනා	579,123.93	1,516,291
	සේවක අර්ථසාධක අරමුදල	263,146.00	616,232
	සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	65,786.49	154,058
	වෙනත් ගිවිසුම් / ජීවන වියදම	575,939.04	1,067,580
	සුභසාධන සහ වෛද්‍ය		
	නිල ඇඳුම් සහ සේදුම්	4,152,641.99	3,729,457
	තේ වියදම්	2,763,811.00	2,527,712
	කාර්ය මණ්ඩල සුබසාධනය	100,180.00	37,656
	ගැස් සහ ආපන ශාලා වියදම්	259,005.00	455,423
	වෛද්‍ය උපදෙස් ලබා ගැනීම්	260,000.00	323,963
	වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීම්	360,361.05	385,649
	පුවත්පත් සහ වාර සඟරා	27,170.00	12,463
		132,557,413.91	109,605,729
02.3	සෘජු පොදු කාර්ය පිරිවැය		
	විදුලි බොයිලේරුව සහ විදුලි ජනක ඉන්ධන	58,598,387.40	61,746,548
	පිරියත හා යන්ත්‍රෝපකරණ නඩත්තු	24,184,401.01	22,351,262
	වක්‍ර නිෂ්පාදන අමුද්‍රව්‍ය	-	343,376
	රක්ෂණ	456,185.59	921,464
	වාහන අළුත්වැඩියා හා නඩත්තු ගාස්තු	2,207,561.77	1,136,545
	කර්මාන්ත ශාලා නඩත්තු ගාස්තු	1,821,128.12	690,107
	වරිපනම් සහ බදු	486,968.60	296,850
	පළිබෝධ පාලනය	970,412.27	616,667
	රසායනික දුම් ගැසීම	329,968.95	443,176
	කර්මාන්ත ශාලා පොදු කාර්ය වියදම්	-	162,604
	දුරකථන	333,234.34	302,121
	රසායනාගාර වියදම්	1,168,119.12	111,414
	වෛද්‍ය මධ්‍යස්ථාන නඩත්තු	-	7,276
		90,556,367.17	89,129,410

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශ සඳහා විස්තරාත්මක සටහන්
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

		2015.12.31 රු. ශත.	2014.12.31 රු.
03.	<u>වෙනත් ආදායම්</u>		
	අපතය විකුණුම්	15,931,714.45	11,651,849
	භාණ්ඩාගාර බිල්පත් මත පොලී ආදායම	3,599,382.96	5,443,747
	ගෝනි විකුණුම්	-	2,068,770
	නිවාස ණය පොලිය	1,364,374.97	1,469,059
	වෙනත් ආදායම්	4,884,242.05	145,610
	විවිධ ආදායම් - විවිධ ද්‍රව්‍ය	-	308,837
	කිරාන් අතපත්තු මහතාගෙන් ලද පරිත්‍යාග	-	-
		25,779,714.43	21,087,872
04.	<u>පරිපාලන වියදම්</u>		
	ගොඩනැඟිලි අළුත්වැඩියා හා නඩත්තු	2,918,952.51	7,791,700
	ආරක්ෂක ගාස්තු	6,932,192.71	7,098,930
	මූලික වැටුප්	8,008,393.00	6,095,071
	කළමනාකරණ ගාස්තු	2,172,404.03	4,545,573
	කාර්යමණ්ඩල සුබසාධනය	1,521,857.19	1,550,191
	ජීවන වියදම	1,560,000.00	1,432,550
	සේවක අර්ථසාධක අරමුදල	1,084,434.32	1,004,288
	අතිකාල	964,760.92	963,301
	ලිපිද්‍රව්‍ය	1,162,744.23	1,203,276
	ප්‍රචාරණය	803,392.50	747,852
	දීමනා	420,000.00	464,720
	තැපැල් ගාස්තු	434,596.00	391,233
	නිවාඩු දීමනා	325,568.25	351,646
	සේවක නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල	271,107.48	241,911
	දුරකථන ගාස්තු	222,156.23	196,561
	සාමාන්‍ය වියදම්	208,291.09	164,340
	රියැදුරු යැපුම් දීමනාව	-	161,375
	උද්‍යාන නඩත්තුව	70,305.46	128,484
	කාර්යාල උපකරණ නඩත්තු	862,565.55	125,052
	නිල ඇඳුම් දීමනාව	-	125,000
	සනීපාරක්ෂක	122,003.64	106,219
	විගණන ගාස්තු	109,807.50	99,825
	කාර්යමණ්ඩල පුහුණු කිරීමේ ගාස්තු	344,400.00	73,500
	තේ වියදම්	-	70,226
	වෙනත් වියදම්	-	54,940
	නෛතික හා වෘත්තිය ගාස්තු	574,758.50	54,600
	ගමන් වියදම්	3,971,579.87	273,682
	දිරි දීමනා	1,037,630.00	844,325
		36,103,900.98	36,360,371
05.	<u>බෙදාහැරීමේ පිරිවැය</u>		
	ප්‍රවාහන ගාස්තු	11,119,781.08	7,232,959
	බෙදාහැරීමේ ගාස්තු	-	-
		11,119,781.08	7,232,959
06.	<u>මූල්‍ය හා වෙනත් වියදම්</u>		
	බැංකු ගාස්තු	58,077.49	867,576
	නැවත සකස්කිරීමේ අලාභය	3,213,954.00	443,713
		3,272,031.49	1,311,290

83/1/2, සුභද්‍රාරාම මාවත,
ගංගොඩවිල, නුගේගොඩ, ශ්‍රී ලංකාව.
දුරකථන අංක : +94 11 2822 164
ෆැක්ස් අංක : +94 11 2372317
ජංගම දුරකථන අංක : +94 71 6840 945
විද්‍යුත් තැපැල : krc@krathnasinghe.com
වෙබ් අඩවිය : www.krathnasignhe.com

2017 අප්‍රේල් මස 07 වන දින

අධ්‍යක්ෂ මණ්ඩලය
ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්,
තැ.පෙ.අංක 17, කපුවත්ත,
ජා ඇල.

හිතවත් මහත්මයාණෙනි,

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් (පීබී 3873)
2015 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂය සඳහා වන විගණනය

2015 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් (සමාගම) හි විගණකවරුන් ලෙස, පෙර කී කාලසීමාව තුළ ඔබගේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අදහස් පළ කිරීම අපගේ මූලික වගකීම විය. කෙසේ වුවද, අපගේ පාරිභෝගිකයින් වෙත උපරිම වටිනාකමක් ලබා දීමේ අප සමාගමෙහි සම්ප්‍රදාය අනුව යමින්, අප වෙර දරනුයේ ඔබගේ ගිණුම්කරණ ගැටලු සඳහා වටිනාකමින් යුතු අදහස්, තොරතුරු සහ විසඳුම් ඔබ වෙත ලබාදීමෙන්, අපගේ ව්‍යවස්ථාපිත වගකීම අභිබවා විහිද යන සේවාවක් ඔබ වෙත ලබා දීමයි. මෙම ලේඛනයෙහි අරමුණ වනුයේ, 2015 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයන්හි අප විසින් සිදු කළ විගණනයෙහිදී පැන නැඟි මූලික කරුණු දක්වා ලීමයි.

1. සමාගම විසින් ඵලදායී පාලන ක්‍රමවේදයක් ලෙස අයවැය භාවිත කරනු නොලැබ ඇති බවත්, වාර්ෂික ඉලක්කගත නිෂ්පාදිතය සහ පිරිවැය පාලනය කිරීම සපුරාලීම පිණිස සමාගම විසින් යථාර්ථවාදී අයවැය පාලනය කිරීම ක්‍රියාත්මක කරනු නොලැබ ඇති බවත් අප විසින් නිරීක්ෂණය කරන ලදී.

1.1 **පසුගිය වර්ෂය හා සසඳන විට සමාගමේ කාර්යසාධනය පිළිබඳ සංඛ්‍යා ලේඛන**

විෂය	2014 (අ)	2015 (ආ)	වෙනස (ආ ජ අ)	ප්‍රතිඵලය
නිෂ්පාදනය (මාස්ටර් බෑග්)	612,068	648,545	36,477	5.96% කින් වැඩිදියුණු වී ඇත.
නිෂ්පාදන පිරිවැය (රු.)	1,628,348,699	1,795,060,980	166,712,281	10.24% කින් පිරිවැය වැඩි වී ඇත
මාස්ටර් බෑගයක පිරිවැය (රු.)	2,660.40	2,767.83	107.42	4.04% කින් පිරිවැය වැඩි වී ඇත
සෘජු ශ්‍රමය සහ කළමනාකරණ පිරිවැය (රු.)	109,605,729	132,557,414	22,951,685	20.94% කින් පිරිවැය වැඩි වී ඇත
පරිපාලන පිරිවැය (රු.)	36,360,371	36,103,901	(256,470)	0.71% කින් පිරිවැය අඩු වී ඇත

2. ඉඩම සඳහා ලේඛනගත සාක්ෂි

නිරීක්ෂණ

ගිණුම්වල සඳහන් රු. 220,000,000/-ක් වන ඉඩමෙහි වටිනාකම තහවුරු කිරීම පිණිස, සමාගම විසින් කිසිදු පිලිගත නොහැකි ලේඛනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති බව අප විසින් නිරීක්ෂණය කරන ලද්දෙමු.

නිර්දේශ

සමාගම් පරිශ්‍රය සඳහා හිමිකම් ඔප්පු ලබා ගැනීමට අපි නිර්දේශ කරමු.

කළමනාකරණ අදහස් දැක්වීම්

අංක 38 දරණ මානක සැලැස්ම මගින් රජයේ ඉඩමක් ලෙස මෙම ඉඩම හඳුනාගනු ලැබ තිබේ.

3. විදුලි තැන්පතුව - කොළඹ

නිරීක්ෂණ

රු. 200,000/- වන කොළඹ විදුලි තැන්පතුව තහවුරු කරගැනීම පිණිස, සමාගම විසින් කිසිදු ලේඛනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති බව අප විසින් නිරීක්ෂණය කරනු ලැබ ඇත්තෙමු.

නිර්දේශය

ඉදිරි දිනවලදී සමාගම විසින් මෙම ශේෂය නැවත අය කරගැනීමට හැකිවන පරිදි, මෙම තැන්පතුව සම්බන්ධයෙන් නිසි ලේඛන පවත්වා ගෙන යාම අපි නිර්දේශ කරමු.

කළමනාකරණ අදහස් දැක්වීම්

මෙම රු. 200,000/- ක් වූ තැන්පතුව තහවුරු කරගැනීම පිණිස කළ ඉල්ලීමක් 2015.01.04 වන දින ලංකා විදුලි බල මණ්ඩලයේ කොළඹ කාර්යාලය වෙත ලිඛිතව යවා ඇත. එහෙත් අදාළ තහවුරු කරගැනීම ලබාගත නොහැකි විය. මෙම තැන්පතුව පිළිබඳ ගිණුම් කටයුතු කිරීම සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් අප විසින් ලබා ගන්නෙමු.

4. ප්‍රකාශිත ප්‍රාග්ධනය

නිරීක්ෂණ

සමාගම විසින් විගණකවරුන් වෙත මෑත කාලීන වාර්ෂික වාර්තාව (ආකෘති පත්‍ර 15) ලබා දී නොමැති බව අපි නිරීක්ෂණය කළෙමු. සිදු කරන ලද විගණකවරුන්ගේ ලිපි ගොනු සොයා බැලීමේදී, සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 304,600,000/- ක් වන බවත්, එම ප්‍රකාශිත ප්‍රාග්ධන වටිනාකම මූල්‍ය ප්‍රකාශ තුළ පෙන්නුම් නොකෙරෙන බවත් අපි නිරීක්ෂණය කළෙමු.

නිර්දේශය

වාරමය වශයෙන් වාර්ෂික වාර්තාව (ආකෘති පත්‍ර 15) සමාගමේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කිරීමටත්, ප්‍රකාශිත ප්‍රාග්ධන ශේෂය මූල්‍ය ප්‍රකාශය තුළ අන්තර්ගත කිරීමටත් අපි නිර්දේශ කරන්නෙමු.

කළමනාකරණ අදහස් දැක්වීම්

වාර්ෂික වාර්තාව රෙජිස්ට්‍රාර් ජනරාල් වරයා වෙත ඉදිරිපත් කරන ලදි. මූල්‍ය ප්‍රකාශ වලට කර ඇති අංක 11 දරන සටහන යටතේ මූල්‍ය ප්‍රකාශය තුළ ප්‍රකාශිත ප්‍රාග්ධනය හෙළිදරව් කර ඇත.

5. කාර්ය පරිපාටි අත්පොත නොමැති වීම

සමාගම සතුව දැනට කාර්ය පරිපාටි අත්පොතක් නොමැත. ඉදිරි වර්ෂවලදී සිය මෙහෙයුම් ව්‍යාප්ත කිරීමට සමාගම අපේක්ෂා කරන හෙයින්, සංකීර්ණ සහ නැවත නැවතත් සිදු වන ගණුදෙනු සඳහා නිරවද්‍ය හා ස්ථාවර ගිණුම්කරණ පිළියම් තහවුරු කිරීම පිණිස, කාර්ය පරිපාටි අත්පොත වැදගත් අවශ්‍යතාවක් වනු ඇත.

සමාගමේ එදිනෙදා මෙහෙයුම්වල වඩා වැදගත් මූල්‍ය සහ ගිණුම්කරණ අංශ හා ගණුදෙනු කිරීම සඳහා යෝග්‍ය අත්පොතක් සංවර්ධනය කළ යුතු බවට අපි යෝජනා කරන්නෙමු. මෙම අත්පොත, ඉතාමත් සංකීර්ණ නොවිය යුතු අතර, එය සකස් කිරීමේදී කාලය නාස්ති කිරීමක් ද සිදු නොවිය

යුතුය. මෙම අත්පොත සියලුම සේවකයින් සඳහා ප්‍රයෝජනවත් පරිශීලන මාධ්‍යයක් ලෙස භාවිත කළ හැකිය. එමඟින් සංවිධානය තුළ ඒකියභාවය සහ අඛණ්ඩතාව ස්ථාපිත කිරීම පිණිස මාර්ගෝපදේශනයක් සහ වත්මන් ක්‍රමවේද ඇගයීමේදී මෙන්ම නව ක්‍රමවේද සම්පාදනය කිරීමේදී ද ආධාරකයක් සපයනු ලබන අතර, නව කාර්යමණ්ඩල පුහුණු කිරීමේදී එය උපකාරී වන බව තහවුරු කළ යුතුය.

වඩාත් ඵලදායී වනු ලබන අයියෙන්, පහත සඳහන් කරුණු අවම වශයෙන් හෝ අත්පොතෙහි අන්තර්ගත විය යුතු බව අපි විශ්වාස කරන්නෙමු.

- වගකීම් ප්‍රකාශය සහ ගිණුම්කරණ කාර්යයන් පිළිබඳ සටහන
- තනතුරු, රාජකාරී සහ වගකීම් පිළිබඳ විස්තර
- ප්‍රමිතින් හා නැවත නැවතත් සිදු වන සටහන් ඇතුලත් කිරීම් වැනි මූලික ගණුදෙණු පිළිබඳ විස්තර කිරීම් සහ නිරූපණය කිරීම් ඇතුලත්ව, අනුගමනය කරනු ලැබීමට නියමිත ක්‍රම, ක්‍රමවේද සහ පාලනය කිරීම් පිළිබඳ විස්තර
- ගිණුම් වගුව
- ක්‍රියාවලිගත කිරීමේදී සහ දත්ත ශිෂ්‍ය ලෙස සුවිගත කිරීමේදී භාවිත කරනු ලැබිය යුතු වෙනත් ආකාරයේ ප්‍රමිතිගත ලේඛන හෝ ආකෘතිපත්‍ර පිළිබඳ විස්තර

<u>කළමනාකරණ අදහස් දැක්වීම්</u>

සී/ස ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම සඳහා කාර්ය පරිපාටි අත්පොතක් සකසනු ලැබ තිබේ. මේ සඳහා සී/ස ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට දැනට කටයුතු කරමින් පවතී.

ස්තුතියි
මෙයට විශ්වාසී,

කපිල රත්නසිංහ සහ සමාගම
වරලත් ගණකාධිකාරීවරු